ක්‍රිස්තුස් වහන්සේගේ

පෙර මඟ දූතයා

ශුද්ධ බයිබලය

"ඔව්හු එක්කෙනෙක් අනිකෙකුට මොරගසමින්, සේනාවල් ස්වාමීන්වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය. මුළු පොළොව උන්වහන්සේගේ තේජසින් පිරී තිබේයයි කීවෝය." (යෙසායා 6:3)

84 වන වෙළුම අංක 06 (984) **2025 නොවැම්බර් / දෙසැම්බර්**

ශුද්ධවූ ජීවිතයක ලක්ෂණ

(ජේ. සී. රයිල් විසිනි) (1816-1900)

"සියල්ලන් සමඟ සමාදානයෙන් සිටින්නත්, ශුද්ධකම නැතුව කිසිවෙක් ස්වාමීන්වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුවයන්නත් උත්සහකරපල්ලා." **(හෙබ්‍රෙව් 12:14)**

ශුද්ධකම පිළිබඳව බයිබලයානුකූල චිත්‍රයක් ඇඳීමට මම උත්සහ කරමි. එවිට අපගේ මනසේ දැස් ඉදිරිපිට එය පැහැදිලිව දැකගත හැකිය. **"ශුද්ධකම යනු දෙවියන් වහන්සේ සමඟ එකඝිතකින් (මනසකින්) සිටීමේ පුරුද්දබව ශුද්ධ ලියවිල්ලේ විස්තරකර ඇති උන්වහන්සේගේ සිත (මනස) අපට දැකගත හැකිය."** එය දෙවියන් වහන්සේගේ විනිශ්චයට එකඟවීමේ පුරුද්ද, උන්වහන්සේ වෛරකරනදේට වෛරකිරීම, උන්වහන්සේ ප්‍රේමකරනදේට ප්‍රේමකිරීම සහ උන්වහනසේගේ වචනයේ ප්‍රමිතියට අනුව මේ ලෝකයේ සෑමදෙයක්ම මැනීමේ පුරුද්දයි.

දෙවියන් වහන්සේ සමඟ සම්පූර්ණයෙන්ම එකඟවන තැනැත්තා ඉතාමත් ශුද්ධ මනුෂ්‍යයෙකි.

"ශුද්ධවූ මනුෂ්‍යයෙකු දන්න සෑම පාපයකින්ම වැළකීසිටීමටත්, දන්න සෑම ආඥාවක්ම පිළිපැදීමටත් උත්සහ කරනු ඇත." ඔහුට දෙවියන් වහන්සේ කෙරෙහි ස්ථීර මනසක්, මුළු හදවතින්ම උන්වහන්සේගේ කැමැත්ත කිරීමට ආශාවක්, ලෝකයාව අප්‍රසාදයට පත්කිරීමට වඩා දෙවියන් වහන්සේව අප්‍රසාදයට පත්කිරීමට ඇති භිය සහ උන්වහන්සේගේ සියළු මාර්ග කෙරෙහි ප්‍රේමයක් ඇත.

"එක්නිසාද අභ්‍යන්තර මනුෂ්‍යයාගේ ප්‍රකාරයට වම දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාවට ප්‍රියවෙමි." **(රෝම 7:22)** යනුවෙන් පාවුල්තුමා පැවසූ විට ඔහු පැවසුවේ ඔහුට හැඟුණ දෙයයි. **"ඔබගේ ආඥාවලට ප්‍රේමකරමි. එබැවින් සියළු දේ ගැන ඔබගේ නියෝග සියල්ල හරියයි සලකමි. සියළු වංක මාර්ග නුරුස්සා හරිමි."** **(ගීතාවලිය 119: 128)** යනුවෙන් දවිත්ට හැඟුණුදේ ඔහු පැවසුවේය.

"ශුද්ධවූ මනුෂ්‍යයෙක් අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙන් වීමට උත්සහ කරනු ඇත." ඔහු උන්වහන්සේ කෙරෙහි ඇදහිල්ලේ ජීවිතයක් ගතකර උන්වහන්සේගෙන් ඔහුගේ දිනපතා සාමය සහ ශක්තිය ලබාගන්නවා පමණක් නොව, උන්වහන්සේ තුල තිබූ මනස (සිත) ලබාගැනීමටත්, උන්වහන්සේගේ ස්වරූපය හිමිකර ගැනීමටත් වෙහෙසෙනු ඇත. (රෝම 8:29) ක්‍රිස්තුස් වහන්සේ අපට සමාවදුන් ආකාරයටම අන් අය සමඟ ඉවසාසිටීම සහ සමාවදීම, ක්‍රිස්තුස් වහන්සේ තමන්වහන්සේව සතුටු කරගැනීමට ක්‍රියානොකළ ආකාරයට පරාර්ථකාමීවීම, ක්‍රිස්තුස් වහන්සේ ප්‍රේමකළ ආකාරයටම ප්‍රේමයෙන් ගමන්කිරීම, ක්‍රිස්තුස් වහන්සේ තමන්වහන්සේවම කීර්තියට පත්කර නොගෙන යටහත් පහත් සහ නිහතමානීවූ ආකාරයටම ක්‍රියාකිරීම ඔහුගේ අරමුණවනු ඇත.

ක්‍රිස්තුස් වහන්සේ සත්‍යය වෙනුවෙන් විශ්වාසවන්ත සාක්ෂිකාරයෙකු වූ බවත්, උන්වහන්සේ පැමිණියේ තමන්ගේම කැමැත්ත කිරීමට නොවන බවත්, උන්වහන්සේගේ පියාණන් වහන්සේගේ කැමැත්ත කිරීම යේසුස් වහන්සේගේ කෑම, බීම බවත්, උන්වහන්සේ අනිත් අයට සේවය කිරීම සඳහා නිරන්තරයෙන් තමන්වහන්සේවම ප්‍රතික්ෂේප කරන බවත්, උන්වහන්සේ දැරීමට නුසුදුසු අපහාස මධ්‍යයේ නිහතමානී සහ ඉවසිලිවන්තවූ බවත්, උන්වහන්සේ සාමාන්‍යය රජවරුන්ට වඩා දේවභක්තිකව සිටි දිළිඳුන් ගැන සිතුබවත්, උන්වහන්සේ පව්කාරයන් කෙරෙහි ප්‍රේමයෙන් හා අනුකම්පාවෙන් පිරිසිටි බවත්, උන්වහන්සේ පාපය හෙළා දැකීමේදී නිර්භීතව හා සම්මුතීන් විරහිතව ක්‍රියාකළ බවත්, උන්වහන්සේට මනුෂ්‍යයන්ගේ ප්‍රශංසාව ලැබිය හැකිව තිබියදී එය නොසෙවූ බවත්, උන්වහන්සේ යහපත කරමින් ගමන් කල බවත්, උන්වහන්සේ ලෞකික මනුෂ්‍යයන්ගෙන් වෙන්වසිටි බවත්, උන්වහන්සේ නොකඩවාම යාච්ඤා කළ බවත්, දෙවියන් වහන්සේගේ කාර්‍ය්‍ය සිදුකිරීමට නියමිතව සිටියදී යේසුස් වහන්සේ උන්වහන්සේගේ ළඟම **(සවිපතව)** ඥාතීන්ට පවා උන්වහන්සේගේ ක්‍රියා මාර්ගවලට බාදකිරීමට ඉඩනුදුන් බවත් මතකතබා ගන්න.

මේ සියල්ල ශුද්ධවූ මනුෂ්‍යයෙකු මතක තබාගැනීමට උත්සහ කරනු ඇත. ඔහු යොහාන්තුමා පැවසූදේ සිතටගනු ලබනවා ඇත. **"උන්වහන්සේ තුළ පවතිමියි කියන තැනැත්තා විසින් උන්වහන්සේ හැසුරුණාක් මෙන් හැසිරිය යුතුය."** (1 **යොහාන් 2:6**) ප්‍රේත්‍රුස් ප්‍රකාශකළාක් මෙන් පවසනු ලබනවා ඇත. **"එසේය, ඊට නුඹළා කැඳවනු ලැබුවහුය. එක්නිසාද ක්‍රිස්තුස් වහන්සේ නුඹළා නිසා වධවිඳ, නුඹළා උන්වහන්සේගේ අඩිපාරේ යන පිණිස නුඹළාට ආදර්ශයක් දී ගියසේක."** (1 **ප්‍රේත්‍රුස් 2:21**) ගැළවීම සහ ආදර්ශය යන දෙකටම ක්‍රිස්තුස් වහන්සේව තම සියල්ල බවට පත්කරගැනීමට ඉගෙනගත් තැනැත්තේ ප්‍රීතියෙන් සන්තෝෂයෙන් සිටින්නෝය. යේසුස් වහන්සේ මා වෙනුවට සිටියානම් උන්වහන්සේ කුමක් කියයිද? කුමක් කරයිද? යන ප්‍රශ්ණය මනුෂ්‍යයන් නිතර තමන්ගෙන්ම අසාගන්නේ නම් බෝහෝ කාලයක් ඉතිරිකර ගතහැකි අතර බොහෝ පාප වළක්වා ගතහැකිවනු ඇත.

"ශුද්ධවූ මනුෂ්‍යයෙකු වෘදුකම, ඉවසීම, යටහත්කම සහ තම දිව පාලනය කරගැනීම අනුගමනය කරනු ඇත." ඔහු බොහෝදේ දරාගනු ලබනවා ඇත. බොහෝදේ ඉවසනවා ඇත. ඔහු තම අයිතිවාසිකම් වෙනුවෙන් පෙනීසිටීම ගැන කථාකිරීමට ප්‍රමාදවනු ඇත. ෂිමෙයි දවිත්ට ශාපකළවිට දවිත්ගේ හැසිරීමෙනුත්, (2 සාමුවෙල් 16:10) මීරියම් සහ ආරොන් මෝසෙස්ට විරුද්ධව කථාකළ විට මෝසෙස්ගේ හැසිරීම තුලිනුත් (ගණන්කථාව 12:3) අපට දීප්තිමත් උදහරණ ලබාදෙන්නේය.

"ශුද්ධවූ මනුෂ්‍යයෙක් ආත්ම සංයමයෙන් සහ ආත්ම ප්‍රිත්‍යාගයෙන් කටයුතු කරනු ඇත." ඔහු තම ශරීරයේ ආශාවන් දමනය කරගැනීමට වෙහෙසෙනු ඇත. ඔහු මාංශයේ තෘෂ්ණාවන් සහ වින්දනයන් කුරුසපත්කර තම ආශාවන්, ලෞකික නැඹුරුවීම් මැඩපවත්වාගෙන ඒවාට කිසිවිටෙකත් ලිහිල්වීමට ඉඩලබා නොදෙයි. ස්වාමීන් වන යේසුස් වහන්සේ

ප්‍රේරිතයන්ට ප්‍රකාශකළ වචනය කොයිතරම් අපූරුද? **"එහෙත් ඒ දවස මලපතක් මෙන් ඔබ්සිසියෙන් නුඹළා කෙරේ නොපැවිණෙන පිණිස අධික කෑමෙන්ද, බීමත්කමින්ද, මේ ජීවිතයේ වෙහෙසින්ද නුඹළාගේ සිත් බරනොවන හැටියට බලාගනිල්ලා."** (**ලූක් 21:34**) එමෙන්ම ප්‍රේරිතවූ පාවුල්ගේ වචන දෙසත් බලන්න. **"නුවුන් මාගේ ශරීරය දවනයකර වාල්කමට පවුණුවවි. එසේ කරන්නේ අනුන්ට දේශනාකළාට පසු කොයි ලෙසකින්වත් මාව එපාකරනු නොලබන පිණිසය."** (1 **කොරින්ති 9:27**)

"ශුද්ධවූ මනුෂ්‍යයෙක් ප්‍රේමය, සහෝදර කරුණාව සහ ත්‍යාගශීලීබව අනුගමනය කරනවා ඇත." ඔහු මනුෂ්‍යයන් තමාට කරනවාට කැමතිදේ අනිත් අයට කිරීමත්, තමන් ගැන අනිත් අය කථාකරනවාට කැමතිදේ තමන් විසිනුත් අනිත් අය ගැන කථාකිරීමත් යන රන්අණ පිළිපැදීමට උත්සහකරනු ඇත. ඔහු ඇදහිල්ල තුල තම සහෝදරයන්ව සිටින අයගේ ශරීර, දේපල, ඔවුන්ගේ චරිත, ඔවුන්ගේ හැඟීම්, ඔවුන්ගේ ආත්මයන් කෙරෙහි සෙනෙහසින් පිරිසිටිනු ඇත. **"එනිනෙකාට ප්‍රේමවීම විස, අන්කිසිවක් ගැන කිසිවෙකුට ණයව නොසිටිල්ලා. එක්නිසාද තමාගේ අසල්වාසියාට ප්‍රේමකරන්නා ව්‍යවස්ථාව සම්පූර්ණකර තිබේ."** (**රෝම13:8**) ශුද්ධවූ මනුෂ්‍යයා සියළු ආකාරයේ බොරුකීම්, අපහාසකිරීම්, කේලාම්කීම්, වංචාකිරීම, වංකකම සහ අසාධාරණ ගනුදෙනු ආදී කාරණා පිළිකුල් කරනවා ඇත. කුඩා දේවලින් පවා ඔහු තම භාහිර හැසිරීම් වලිනුත් තම ආගම (භක්තිය) අලංකාර කිරීමටත්, ඔහු වටා සිටින සියල්ලන්ගේ ඇස් හමුවෙහි අලංකාර හා සුන්දර ලෙස සිටීමටත්, උත්සහ දරනු ඇත. 1 කොරින්ති 13: වන පරිච්ඡේදය සහ කන්දුළඩ දේශනාව තුල ඇති බොහෝ ප්‍රකාශන ක්‍රිස්තියානීන්ගේ හැසිරීම් සමඟ තැබූවිට එම ප්‍රකාශන මොනතරම් හෙළාදැක තිබෙනවාද?

"ශුද්ධවූ මනුෂ්‍යයෙක් අනිත් අය කෙරෙහි දයාවේ සහ කරුණාවේ ආත්මයක් අනුගමනය කරනු ඇත." ඔහු දවස මුළුල්ලේ අලසකමින් (වැදගැම්මකට නැතිදේ කරමින්) ක්‍රියාකරන්නේ නැත. ඔහු අනිත් අයට පීඩාකොට තෘප්තියට පත්වන්නේ නැත. ඔහු යහපත කිරීමට උත්සහකරනු ලබයි. ඔහු තම දවසට සහ පරම්පරාවට ප්‍රයෝජනවත්වීමටත් ඔහු තමා වටා ඇති අධ්‍යාත්මික දිළිඳුකම සහ දුක්ඛිතභාවය හැකිතාක් අඩුකිරීමටත් උත්සහ දරනු ඇත. දොර්කස් එවැන්නෙකි. **"දොර්කස් යන අර්ථ ඇති තබීතා නම් එක්තරා ගෝල ස්ත්‍රියෙක් යොප්පාවෙහි සිටියාය. වේ ස්ත්‍රී බොහෝ යහපත් ක්‍රියාවලද දැන දීමෙහිද යෙදී සිටියාය."** (**ක්‍රියා 9:36**) ඇය අරමුණ ගැන කථාකරමින් සිටියේ නැත. නමුත් ඒවා ඉටුකළේය. පාවුල්තුමාද එවැනිකෙනෙකි. **"මම ඉතා සන්තෝෂයෙන් නුඹළාගේ ආත්මගැන මට ඇතිදේ වියදම් කරන්නෙමි. මම ව්‍යාවෘතවන්නෙමි. මම වැඩියෙන් නුඹළාට ප්‍රේමකරන තරමට අඩුවෙන් ප්‍රේමකරනු**

2 පිටුවට

1 පිටුවෙන්

ශුද්ධවූ ජීවිතයක ලක්ෂණ..

ලබවිද?" (2 කොරින්ති 12:15)

"ශුද්ධවූ මනුෂ්‍යයෙකුගේ හදවත පාරිශුද්ධත්වය පසුපස හඹායනු ඇත." ඔහු සියළු දුරාචාරයට සහ ආත්මයේ අපිරිසිදුකමට බියවනු ඇත. එමෙන්ම ඔහුව ඊට ඇදගතහැකි සියළු දේවලින් වැළකී සිටීමට උත්සහකරනු ඇත. ඔහුගේ හදවත වහා ගිනිඇවිලෙන දෙයක් බව දන්නා බැවින් පරීක්ෂාවේ ගිනි පුපුරු වලින් වහා ආරක්ෂා වනුඇත. දවිත්ට පාපයට වැටීමට හැකිවූයේ නම්, තමාගේම ශක්තිය ගැන කථාකිරීමට එඩිතර වන්නේ කවුද?

"ශුද්ධවූ මනුෂ්‍යයෙක් දෙවියන් වහන්සේට භියවන ආකාරයටම කටයුතු කරනු ලබයි." මම මෙයින් අදහස් කරන්නේ වහලෙක් මෙන් දඬුවමට භියවන නිසා පමණක් වැඩකරන සහ අලසකම නිසා දැඩිලෙස භියවී සිටින බව සොයාගැනීමට හැකිවීම පිළිබඳව නොවේ. මම අදහස් කරන්නේ දරුවෙකුට ඇති භිය පිළිබඳවයි. ඔහු සෑමවිටම තම පියා ඉදිරියේ හැසිරීමට සහ ජීවත්වීමට කැමැත්තෙන් සිටියි. මක්නිසාද පියා දරුවාට ආදරය කරන්නේය. මේ සම්බන්ධයෙන් නෙහෙමියා අපට ලබාදෙන්නේ මොනතරම් උතුම්වූ ආදර්ශයක්ද? ඔහු යෙරුසලමේ ආණ්ඩුකාරයාවූ විට ඔහුට යුදෙව්වරුන්ගේ සහයෝගය ලබාගතහැකිව තිබූ අතර ඔහුගේ ආහාර සඳහා මුදල් ඉල්ලා සිටීමට හැකිය. ඔහුට කලින් සිටියාවූ ආණ්ඩුකාරවරු එසේකර තිබුණි. නෙහෙමියාත් එසේකළා නම් ඔහුට දොස්කීමට කිසිවෙකුට පුළුවන්කමක් නැත. නමුත් නෙහෙමියා මෙසේ පැවසුවේය. **"නුවුන් මට ඉස්සර්න් සිටි පළවු දිසාපතිවූ සෙනගට බර්ක්වී, කෑවත් වුදික පානයන් හැර වීදී ෂෙකෙල් හතළිහකුත් ගත්තෝය. එසේය, ඔවුන්ගේ සේවකයෝ පවා සෙනග කෙරෙහි ආණ්ඩුකළෝය. එහෙත් මම දෙවියන් වහන්සේ කෙරෙහි භය ඇතුව සිටි නිසා එසේ නොකළෙවි." (නෙහෙමියා 5:15)**

"ශුද්ධවූ මනුෂ්‍යයෙක් නිහතමානීකම අනුගමනය කරනුඇත." ඔහු යටහත් පහත් මනසකින් යුතුව තමාට වඩා අන් සියල්ලන්ම උසස් ලෙස සැලකීමට කැමතිවනු ඇත. ලෝකයේ වෙනත් ඕනෑම කෙනෙකු තුල තිබෙනවාට වඩා තමන්ගේ හදවතේ තිබෙන නපුර ඔහු දකින්නේය. **"ආලුහාව් උත්තර දෙවින්, බැලූව මැනව, ධූලි සහ අළු පමණක් වූ මම ස්වාමීන්වහන්සේට කථාකරන්ට ධෛර්ය්‍යගතිවි."** (උත්පත්ති 18:27) කියා ආබ්‍රහම් පවසනවිට තමාගේ යම් කාරණා ගැන ඔහුට යම් වැටහීමක් තිබුණි.

"ඔබගේ මෙහෙකරුවාට දැක්වූ සියළු කරුණා වලින් ඉතා සුළු එකක්වත් ඔබගේ ලුළු විශ්වාසකමවත් ලැබීමට නොවටිවි."(උත්පත්ති 32:10) කියා යාකොබ් පවසන විට ඔහුගේ හැඟීම දෙස බලන්න.

"මම නීචයෙක්වි, ඔබට උත්තරයක් දෙන්නේ කෙසේද? මාගේ අතින් කට වසා ගනිවි." (යෝබ් 40:4) කියා යෝබ් පයසන විට ඔහුගේ හැඟීම දෙස බලන්න.

"පව්කාරයන් ගළවන්ට ක්‍රිස්තුස් යේසුස් වහන්සේ ලෝකයට ආසේක යන කීම විශ්වාසවූ සර්ව ප්‍රකාරයෙන් පිළිගතවූ කීමක්ය. ඔවුන් අතරෙන් මම ප්‍රධාන පව්කාරයාය." (1 තිමෝති 1:15) කියා පාවුල් පවසන විට ඔහුගේ හැඟීම දෙස බලන්න.

ක්‍රිස්තුස් වහන්සේගේ විශ්වාසවන්ත මෙහෙකරුවෙක් වූ වේදසාක්ෂිකාර යෙක් ලෙස ජීවිතය පූජාකළ ජෝන් බ්‍රැඩ්ෆර්ඩ් සමහර විට ඔහුගේ ලිපි අවසන් කළේ **"අතීශයින්ම කාලකණ්ණි පව්කාරයෙක්වූ ජෝන් බ්‍රැඩ්ෆර්ඩ්"** යන වචන වලින්ය.

භක්තිමත් මනුෂ්‍යයෙක්වූ **"විලියම් ග්‍රිව්ෂෝ "** මරණමංචකයේ වැතිර සිටියදී පැවසූ ඔහුගේ අවසාන වචනවුයේ, **"මෙන්න ලාභනොලබන සේවකයෙක් "** යනුවෙනි.

"ශුද්ධවූ මනුෂ්‍යයෙක් ජීවිතයේ සියළු යුතුකම් හා සම්බන්ධතාවයන් වලදී විශ්වාසවන්තකම අනුගමනය කරනු ඇත." ඔහු උත්සහ කරන්නේ තමාගේ ආත්මය ගැන නොසිතන අනිත් අයමෙන් තමාගේ ස්ථානය පුරවා ගැනීමට නොවේ. මන්ද ඔහුට ඒ අයට වඩා උසස් අභිප්‍රායන් සහ වඩා වැඩි උපකාරයන් තිබෙන බැවිනි. පාවුල්ගේ වචන කිසිවිටෙකත් අමතක නොකලයුතුය. **"නුඹළා කරන කොයිදෙයක් නුවුන් මනුෂ්‍යයන්ට නොව ස්වාමීන්වහන්සේට මෙන් සිතෙන් කරපල්ලා. නුඹළා සේවය කරන්නේ ස්වාමීවූ ක්‍රිස්තුස් වහන්සේටය." (කොලොස්සි 3 :24) "උත්සහවන්තකමේදී මැළිනොවෙල්ලා, ආත්මයෙන් ජ්වලිතවෙයල්ලා, ස්වාමීන්වහන්සේට සේවයකරපල්ලා."** (රෝම 12:11)

ශුද්ධවූ මනුෂ්‍යයෙක් සෑමදෙයක්ම හොඳින් කිරීමට ඉලක්ක කලයුතු අතර දුර්වලවූ යම්දෙයක් කිරීමට උපකාර කරනලෙස ඔවුන්ගේ ජීවිතවල ඉඩහරින්නේ නම් ඒ ගැන ලැජ්ජා වියයුතුය. දනියෙල් මෙන් තම දෙවියන් වහන්සේගේ ව්‍යවස්ථාව සම්බන්ධයෙන් හැර තමන්ට විරුද්ධව කිසිදු අවස්ථාවක් ලබානොදීමට උත්සහ කළයුතුය. (දනියෙල් 6:5) ශුද්ධවූ මනුෂ්‍යයන් යහපත් ස්වාමිපුරුෂයන්, යහපත් භාර්‍යාවන්, හොඳ දෙමව්පියන්, හොඳ දරුවන්, හොඳ ස්වාමිවරුන්, හොඳ සේවකයන්, හොඳ අසල්වැසියන්, හොඳ මිතුරන්, හොඳ යටත්වැසියන්, වන්නෝය. පුද්ගලිකව සහ ප්‍රසිද්ධියේ යහපත්ව සිටින්නෝය. ව්‍යාපාරික ස්ථානයේ සහ සමීප සම්බන්ධතාවලින් යහපත්ව සිටින්නන්වීමට උත්සහ කළයුතුය.

ශුද්ධකම මේ ආකාරයෙන් ඵලදරන්නේ නැතිනම් සැබවින්ම එහි වටිනාකමක් නැත. ස්වාමීවූ යේසුස් වහන්සේ ඔවුන්වම සෝදිසිකර ගැනීමට ගෝලයන්ට ප්‍රශ්ණයක් යොමුකළසේක. එනම්, **"නුඹළාගේ සහෝදරයන්ට පවණක් ආවාර කරනවා නවි නුඹළා අනුන්ට වඩා කුවක් කරන්නහුද? අන්‍යජාතීහු පවා එසේ නොකරද්ද?" (මතෙව් 5:47)**

"අවසාන වශයෙන්, ශුද්ධවූ මනුෂ්‍යයෙක් ආත්මික මනසක් අනුගමනය කරනු ඇත. (එය අවව වශයෙන් කරනදෙයක් නොවිය යුතුය.)" ඔහු තම සෙනෙහස ඉහළ දේවල් කෙරෙහි තැබීමට උත්සහ කරනු ඇති අතර පොළොවේ දේවල් ඉතා ලිහිල් අතකින් අල්ලාගනු ඇත. ඔහු වර්තමාන ජීවිතයේ කටයුතු නොසලකා හරින්නේ නැත. නමුත් ඔහුගේ මනසේ සහ සිතුවිලිවල පළමු ස්ථානය සදකාලික දේවලට ලබාදෙනු ඇත. ඔහු ස්වර්ගීක වස්තුව ඉලක්ක කරගෙන ජීවත් වෙන අතර ආගන්තුකයෙක් සහ වන්දනාකරුවෙක් ලෙස මේ ලෝකය පසුකර ස්වර්ගීය නිවසටයාමට ඉලක්ක කරගනු ලබති.

යාච්ඤාවෙන් දෙවියන් වහන්සේ සමග සම්බන්ධව සිටීම, බයිබලයෙන් සහ ඔහුගේ සෙනගගේ රැස්වීම්වලදී අදහස් හුවමාරුකරගැනීම වැනි කාරණා ශුද්ධවූ මනුෂ්‍යයෙකුගේ ප්‍රධාන විනෝදය වනුඇත. ඔහුව දෙවියන් වහන්සේට සමීපකරවන සෑමදෙයක්ම, සෑමස්ථානයක්ම සහ සෑම සම්බන්ධතාවයක්ම අගේකරනු ලබති. **"මාගේ ආත්මය ඔබට ඇළුම්ව ඔබ අනුවයයි. ඔබගේ දකුණත මා උසුලයි."(ගීතාවලිය 63:8) "මාගේ කොටස නවි ස්වාමීන්වහන්සේය. ඔබගේ වචන පවත්වන්නෙමියි කීයෙවි." (ගීතාවලිය 119:57)**

මම යාන්තමින් ඇඳ ඇති එවැනි චරිතයක් ලැබීම සියළු සැබෑ කිතුණුවන්ගේ හදවතේ ආශාව සහ යාච්ඤාව බව මම විශ්වාස කරමි. ඔවුන් එයට ළඟා නොවන්නේ නම් ඔවුන්ව එයට තල්ලුකරනු ලබයි. ඔවුන්ට එය සාක්ෂාත් කරගත නොහැකි වියහැකි නමුත් ඔවුන් සෑමවිටම එය ඉලක්ක කරගනු ලබයි. ඔවුන් සිටින ආකාරය එය නොවේ නම් ඔවුන් උත්සහ කරන්නේ සහ වෙහෙසෙන්නේ එසේවීමටයි.

ඒවගේම මම නිර්භීතව සහ විශ්වාසයෙන් කියනවා **"සැබෑ ශුද්ධකම ශ්‍රේෂ්ඨ යථාර්ථයක් කියලා."** එය මනුෂ්‍යයෙක් තුල ඇති දෙයක් එය ඔහු වටා සිටින සියල්ලන්ට දැකියහැකි, දැනගතහැකි, සළකුණු කළහැකි සහ දැනියහැකි දෙයකි. එය සැහැල්ලුයි, එහි පවතින්නේ නම් (එහි රැඳිසිටින්නේ නම්) එයින් තමාව ප්‍රකාශ වන්නේය. එය ලුණුය. එහි රසය දැනෙන්නේය. එය වටිනා ආලෙපනයකි. එය පවතී නම් එහි සුවඳ සැඟවිය නොහැකිය.

ජේ. සී. රයිල් විසින් රචිත **"ශුද්ධකම"** නැමති පොතෙන් උපුටාගන්නා ලදි.

දෙවියන් වහන්සේගේ ශුද්ධකම

"ස්වාමිනි, ඔබගේ නාමයට භය නොවන්නෙත්, ගෞරව නොකරන්නෙත් කවුද? මක්නිසාද ඔබ පමණක්ම ශුද්ධය. එබැවින් සියළු ජාතීන් පැමිණ ඔබ ඉදිරියේ නමස්කාර කරනවා ඇත. මක්නිසාද ඔබගේ ධර්මිෂ්ඨ ක්‍රියා ප්‍රකාශකරනලද්දේයයි කීවෝය." (එළිදරව් 15:4) දෙවියන් වහන්සේ පමණක් ස්වාධීනව, සදකාලිකවම, නොවෙනස්ව ශුද්ධව සිටිනසේක. ශුද්ධ ලියවිල්ලෙහි නිතරම උන්වහන්සේව **"ශුද්ධ තැනැත්තාණන්සේ "** ලෙස හඳුන්වනු ලැබේ. උන්වහන්සේ එසේවන්නේ සියළු සදාචාරාත්මක විශිෂ්ඨත්වයේ එකතුව උන්වහන්සේ තුල දක්නට ලැබෙන බැවිනි. උන්වහන්සේගේ පාරිශුද්ධත්වය සැබවින්ම පාපයේ සෙවනැල්ලෙන් පවා නොකැලැල්ව තිබෙන සේක. **"අප විසින් උන්වහන්සේගෙන් අසා නිබෙන්නාවූ, නුඹළාට දන්වන්නාවූ පණිවිඩය නවි, දෙවියන් වහන්සේ ආලෝකය බවත් උන්වහන්සේ තුල කිසිම අන්ධකාරයක් නැති බවත්ය."** (1 යොහාන් 1:5) ශුද්ධකම යනු දිව්‍ය ස්වාභාවයේ විශිෂ්ඨත්වයයි. ශ්‍රේෂ්ඨවූ දෙවියන් වහන්සේ **"ශුද්ධකමින් මහිමවත්ය."** (නික්මයාම 15:11) එබැවින් අපි මෙසේ කියවන්නෙමු. **"නපුර බලන්ට බැරි තරම් පවිත්‍ර ඇස් ඇත්තාවූ, හිංසාව බලාසිටින්ට නොහැකිවූ ඔබවහන්සේ ද්‍රෝහීන් දෙස බලාසිටින්නෙත්, දුෂ්ඨයා තමාට වඩා ධර්මිෂ්ඨ තැනැත්තා නාස්ති කරනකල ඔබ නිශ්ශබ්දව සිටින්නෙත්...,"(හබක්කුක් 1:13)**

දෙවියන් වහන්සේගේ බලය මැවිල්ලේ දුර්වලතාවයන්ට ප්‍රතිවිරුද්ධ බැවින් උන්වහන්සේගේ ප්‍රඥාව මනුෂ්‍යයාගේ අවබෝධයට, අණුවනකමට, සම්පූර්ණයෙන්ම වෙනස් බැවින් ශුද්ධකම සියළු සදාචාරාත්මක කැලැල් හෝ අපිරිසිදුකමට ප්‍රතිවිරු -ද්ධව තිබේ. අතීතයේදී ඊශ්‍රායෙල්හී උන්වහන්සේගේ ශුද්ධකමේ අලංකාරය ගැන ප්‍රශංසා කිරීමට ගායනාකාරයන් පත්කළේය. (2 ලේකම් 20:21) "බලය යනු දෙවියන් වහන්සේගේ අත හෝ හස්තයයි. සර්වඥතාවය යනු උන්වහන්සේගේ ඇසයි. සදකාලිකත්වය උන්වහන්සේගේ කාලසීමාවයි. දයාව උන්වහන්සේගේ උදරයයි. එමෙන්ම ශුද්ධකම

(ආතර් ඩබ්: පින්ක් විසිනි) (1886-1952)

උන්වහන්සේගේ අලංකාරයයි." (එස්. චාර්නොක්) පාපයේ ආධිපත්‍යයෙන් මිදුණු අයට ප්‍රේමය දක්වන්නේ මෙම උත්තරීතරත්වය තුලිනි.

දෙවියන් වහන්සේගේ මෙම පරිපූර්ණත්වය කෙරෙහි ප්‍රධාන අවධාරණයක් ලබාදී ඇත. දෙවියන් වහන්සේ පිළිබඳ හඳුන්වාදීමේදී **"සර්වබලධාරී"** ලෙස හඳුන්වා දෙනවාට වඩා **"ශුද්ධ"** ලෙස හඳුන්වා දෙනු ලබන අතර උන්වහන්සේගේ ගෞරවය වෙනත් ඕනෑම දෙයකට වඩා ශුද්ධකම තුලින් ප්‍රකාශකර ඇත. මෙය උන්වහන්සෙගේ නාමයට විරුධාවලියක් ලෙස වෙනත් ඕනෑම දෙයකට වඩා ස්ථාවරව තිබේ. උන්වහන්සේගේ බලවත් නාමය හෝ උන්වහන්සේගේ ප්‍රඥාවන්ත නාමය ප්‍රකාශකර ඇති බව ඔබට කිසිදු සොයාගත නොහැකිය.

3 පිටුවට

"සැබෑවේ ධර්මිෂ්ඨකමින්ද, ශුද්ධකමින්ද, දෙවියන් වහන්සේට සමානව මවන ලද්දවූ අළුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය." (එපීස 4:24)

2පිටුවෙන්

දෙවියන් වහන්සේගේ ශුද්ධකම...

නමුත් උන්වහඑන්සේගේ ශ්‍රේෂ්ඨතම ගෞරව නාමය උන්වහන්සේගේ ශුද්ධකමයි. දෙවනුව මෙයින් උන්වහන්සේගේ නාමයේ තේජස සහ ගෞරවනීය බව දිස්වේ. (එස්. චාර්නොක්)

මෙම පරිපූර්ණත්වය අන් කිසිවෙකුට වඩා ස්වර්ගයේ සිංහාසනය ඉදිරිපිට ගෞරවාන්විතව සමරනු ලැබේ. සෙරාෆ්වරු මොරගසමින් සේනාවල ස්වාමීන් වහන්සේ ශුද්ධය, ශුද්ධය, ශුද්ධය, කියා පවසන්නේය. දෙවියන් වහන්සේම වරක් මෙම පරිපූර්ණත්වය මෙලෙස භාවිතා කළසේක. **"මාගේ ශුද්ධකම කියා එක්වරක් දිවිරීමි, දවිත්ට බොරු නොකියන්නෙමි."** (**ගීතාවලිය 89:35**) දෙවියන් වහන්සේම උන්වහන්සේගේ ශුද්ධකමෙන් පොරොන්දු වූ (දිව්රූ) සේක. මක්නිසාද එය අනික් සියල්ලට වඩා සම්පූර්ණ ප්‍රකාශයකි. එබැවින් අපට අනුශාසනා කර ඇත්තේ..., **"ස්වාමීන්ගේ ශුද්ධවන්තයෙනි, උන්වහන්සේට ප්‍රශංසා ගී කියව්. උන්වහන්සේගේ ශුද්ධවූ නාමයට ස්තුති කරව්."**(**ගීතාවලිය 30:4**) කියාය. **"මෙය උත්කෘෂ්ඨ (භෞතික සීමාවන් ඉක්මවා යන) ස්වාභාවයකි. එය ඔවුන් වත දීප්තිය විහිදුවයි. එය පවසා දෙන්නාවූ ගුණාංගයකි." (ජේ. හෝවේ 1670) "ස්වාමීන්ගෙන් එක දෙයක් ඉල්ලීමි, ඒක සොයන්නෙමි, එනම් ස්වාමීන්ගේ අලංකාරය දකින පිණිසත් උන්වහන්සේගේ මාළිගාවේදී භාවනාකරන පිණිසත් මාගේ ජීවිතයේ සියළු දවස්වලදී ස්වාමීන්ගේ ගෘහයේ වාසය කිරීමය." (ගීතාවලිය 27:4) " ඔබගේ පබාකුලයේ දවසේදී ඔබගේ සෙනඟ කැමැත්තෙන් පූජාවෙති. උදය ගර්භයෙන් නිකුත්වූ, ශුද්ධකමේ අලංකාරයෙන් යුක්තවූ ඔබගේ යෞවනකමේ පිනි ඔබට ඇත්තේය." (ගීතාවලිය 110:3)**

"ශුද්ධකම උන්වහන්සේගේ අනෙකුත් සියළු පරිපූර්ණත්වයන්ට වඩා විශිෂ්ඨත්වයට අභියෝග කරන බව පෙනෙන්නේය. එහි අනෙක් සියල්ලේම මහිමය රැඳිතිබෙන්නේය. එය දේවත්වයේ මහිමය වන ආකාරයටම එය දේවත්වයේ සෑම සම්පූර්ණත්වයකම මහිමයයි. දෙවියන් වහන්සේගේ බලය උන්වහන්සේගේ ශක්තිය ප්‍රකාශකරන ආකාරයටම ශුද්ධකම උන්වහන්සේගේ අලංකාරය ප්‍රකාශ කරනු ලබයි. සියල්ලන්ම දුර්වලව සිටින අතර ඔවුන්ට උපකාර කිරීමට සර්වබලධාරීත්වයක් සහ සියල්ලන්ව අලංකාර කිරීමට ශුද්ධකම නොමැතිව අශෝභනව සිටිති. මෙය අපවිත්‍ර වුවහොත් අනිත් සියල්ලේම ගෞරවය අහිමිවනු ඇත. ඒ මොහොතේම සූර්‍යයාගේ ආලෝකය නැතිවීයන පරිදි එහි තාපය, ශක්තිය, එහි උත්පාදනය සහ ප්‍රාණවත් ගුණය නැතිවීයනු ඇත. අවංකකම කිතුණුවෙකුතුල සෑම කාරණාවකම දීප්තිය වන්නාක්මෙන්ම දේවත්වයේ සෑම ගුණාංගයකම තේජස වන්නේ පාරිශුද්ධත්වයයි. උන්වහන්සේගේ යුක්තිය ශුද්ධවූ යුක්තියකි. උන්වහන්සේගේ ප්‍රඥාව ශුද්ධවූ ප්‍රඥාවකි. උන්වහන්සේගේ බලයේ හස්තය ශුද්ධවූ හස්තයකි. (ගීතාවලිය 98:1) උන්වහන්සේගේ සත්‍යතාවය හෝ පොරොන්දුව ශුද්ධවූ පොරොන්දුවකි. (ගීතාවලිය 105:42) උන්වහන්සේගේ සියළු ගුණාංග ඒකාබද්ධව සංඛේතවත් කරන උන්වහන්සේගේ නාමය ශුද්ධය. (ගීතාවලිය 103:1)" (එස් චාර්නොක්)

දෙවියන් වහන්සේගේ ශුද්ධකම ප්‍රකාශකිරීම

"දෙවියන් වහන්සේගේ ශුද්ධකම උන්වහන්සේගේ ක්‍රියාවලින් ප්‍රකාශවේ." "ස්වාමීන් වහන්සේ ස්වකීය සියළු මාර්ගයන්හී ධර්මිෂ්ඨය, ස්වකීය සියළු ක්‍රියාවලින් දයාවන්තය." (ගීතාවලිය 145:17) උන්වහන්සේගෙන් විශිෂ්ඨදේ හැර අන් කිසිවක් පැමිණිය නොහැකිය. ශුද්ධකම යනු උන්වහන්සේගේ සියළු ක්‍රියාවල නියමයයි. ආරම්භයේදී උන්වහන්සේ තමන්වහන්සේ සෑදූ සියල්ල ඉතා යහපත් බව ප්‍රකාශ කල අතර (උත්පත්ති 1:31) ඒවායේ අසම්පූර්ණ හෝ අශුද්ධ දෙයක් තිබුණේනම් එය උන්වහන්සේට කළනොහැකිය. මිනිසාව අවංක ලෙස උන්වහන්සේගේ ස්වරූපයෙන් හා සමානත්වයෙන් සාදන ලදි. (දේශනාකාරයා 7:29) වැටුණු දේවදූතයන්ද ශුද්ධලෙස මවා තිබුණුසේක. නමුත් ඔවුන් ඔවුන්ගේ පළමු වාසස්ථානය අත්හැරිය බව ලියාතිබේ. (යූදස් 1:6) සාතන් ගැන ලියාඇත්තේ මෙසේය, **"නුඹ මවනුලැබූදා, පටන් නුඹතුල අධර්මිෂ්ඨකම සම්බවෙන තුරු නුඹේ මාර්ගවල නුඹ සම්පූර්ණව සිටියෙහිය." (එසකියෙල් 28:15)**

"දෙවියන් වහන්සේගේ ශුද්ධකම උන්වහන්සේගේ ව්‍යවස්ථාව තුළින් ප්‍රකාශවේ." එම ව්‍යවස්ථාව සියළු අළුත්කිරීම් වලදීත් (සංශෝධනය කිරීම් වලදීත්) පාපය තහනම් කරනුලබයි. එයින් මනසෙහි අභිප්‍රාය, ශාරීරික කිළුටුකම්, රහස් ආශාවන් මෙන්ම ප්‍රකාශිත ක්‍රියාවන් වඩා යහපත්බවට පත්කරන්නේය. එබැවින් අපි මෙසේ කියවන්නෙමු.**"එබැවින් ව්‍යවස්ථාව ශුද්ධය, ආඥාවද ශුද්ධය, ධර්මිෂ්ඨ ය, යහපත්ය." (රෝම 7:12) "ස්වාමීන්ගේ පනත් සාධාරණය, සිත ප්‍රීතිකරවන්නේය. ස්වාමීන්ගේ ආඥාව පවිත්‍රය, ඇස් එළියකරවන්නේය. ස්වාමීන් කෙරෙහි භය පිරිසිඳුය, සදකල් පවත්නේය. ස්වාමීන්ගේ විනිශ්චයෝ සැබෑය, සම්පූර්ණයෙන්ම ධර්මිෂ්ඨය."(ගීතාවලිය 19:8-9)**

"දෙවියන් වහන්සේ ශුද්ධකම කුරුසියේදී ප්‍රකාශවේ." ආශ්චර්‍යමත් ලෙස සහ වඩාත් බරුරුම් ලෙස පව්කමාව ලබාදීම තුලින් දෙවියන් වහන්සේගේ අසීමිත ශුද්ධකම හා පාපය පිළිකුල්කිරීම ප්‍රකාශවේ. දෙවියන් වහන්සේ තම පුත්‍රයාණන්ට පාපය ආරෝපණය කලවිට එයට උපරිම දඬුවම් කිරීමෙන් පෙන්වන්නේ දෙවියන් වහන්සේට පාපය කොයිතරම් පිළිකුල්ව තිබෙනවාද කියාය.

"දුෂ්ඨ (නපුරු) ලෝකය මත වත්කර ඇති හෝ වත්කරනු ලබන මුළු විනිශ්චය, පව්කාරයෙකුගේ හෘර්දය සාක්ෂියේ ගිනි උදුන, කැරළිකාර අශුද්ධාත්මවලට එරෙහිව ආපසු හැරවිය නොහැකි ප්‍රකාශකරනලද දඬුවම සහ ශාපයටලක්වූ මැවිල්ලේ කෙදිරිගෑම් පිළිබඳව දෙවියන් වහන්සේගේ අප්‍රසන්නකම ප්‍රකාශ කරන්නේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි උන්වහන්සේගේ උදහස මුදහැරිය ආකාරයට නොවේ. අපගේ ගැළවුම්කරුවාණන් කුරුසියේ මරණයට පත්වන කෙදිරිගෑම් මධ්‍යයේ උන්වහන්සේගේ මුහුණ වඩාත් අවලක්ෂණවූ අවස්ථාවේ තරම් දිව්‍ය ශුද්ධකම කිසිදුක ලස්සන සහ ආදරණීය ලෙස පෙණුනේ නැත. දෙවියන් වහන්සේ තම සිනහ මුසු මුහුණ යේසුස් වහන්සේගෙන් ඉවතට හරවා ගත්විට ගීතාවලිය 22: වන ගීතිකාවේදී උන්වහන්සේම මෙය පිළගත්සේක. එය උන්වහන්සේගේ, **"මාගේ දෙවියනි, මාගේ දෙවියනි, ඔබ මා අත්හැරියේ මක්නිසාද?"** යන භයානක මොරගැසීමට හේතුවූසේක. (ගීතාවලිය 22:1)" (එස්. චාර්නොක්)

"දෙවියන් වහන්සේ ශුද්ධ බැවින් සියළු පාපයන් ද්වේශ කරනසේක." උන්වහන්සේගේ ව්‍යවස්ථාවට අනුකූල සියල්ලට උන්වහන්සේ ප්‍රේමකරන අතර එයට පටහැනි සියල්ලට ද්වේශ කරනසේක. උන්වහන්සේගේ වචනයේ පැහැදිලිවම ප්‍රකාශ කරන්නේ, **"මක්නිසාද වංක තැනැත්තා ස්වාමීන් වහන්සේට පිළිකුලක්ය. නුමුත් උන්වහන්සේගේ මිත්‍රකම අවංක අය සමග ඇත්තේය." (හිතෝපදේශ 3:32) "දුෂ්ඨයන්ගේ යෝජනා ස්වාමීන් වහන්සේට පිළිකුලක්ය. එහෙත් පවිත්‍රයන්ගේ වචන උන්වහන්සේට ප්‍රසන්නය." (හිතෝපදේශ 15:26)** එබැවින් උන්වහන්සේ අනිවාර්‍යයෙන්ම පාපයට දඬුවම් කළයුතුය. උන්වහන්සේගේ දඬුවම නොලබා, උන්වහන්සේගේ ද්වේශකිරීම නොලබා පාපයට තවදුරටත් පැවතිය නොහැකිය. දෙවියන් වහන්සේ නිරතුරුවම පව්කරුවන්ට සමාවදෙන නමුත් උන්වහන්සේ කිසිවිටෙක පාපය නොසලකා නොහරිනසේක. පව්කරුවන්ට සමාව ලැබෙන්නේ ලේ වැගිරීමක් තුලින්වේ. **"ව්‍යවස්ථාවේ ප්‍රකාරයට සියළු දේවල්ම ලෙයින් පවිත්‍රකරනු ලැබේයයි කියන්ට පුළුවන්වා වාගේ පෙනේ ලේ වැගිරීමක්ද නැතුව ක්ෂමාකිරීමකුත් නැත."(හෙබ්‍රෙව් 9:22)** එක් පාපයක් නිසා අපේ මුල් දෙමව්පියන්ව දෙවියන් වහන්සේ ඒදන් උයනෙන් පිටුවහල් කළසේක. එක් පාපයක් නිසා මෝසෙස්ට කානාන්දේශයට යාමටනොහැකි විය. එළිෂාගේ සේවකයාවූ ගෙහාසි කුෂ්ඨරෝගියෙක් විය. අනනියස් සහ සප්පිරා මරණයට පත්වී සදකාල ජීවනයෙන් වෙන්කරනලදි.

පව්කාර මනුෂ්‍යයාගේ දෘෂ්ඨිකෝණයෙන් දෙවියන් වහන්සේගේ ශුද්ධකම

ශුද්ධලියවිල්ලේ දේවානුභාවය පිළිබඳ සාක්ෂි අපට මෙහිදී සොයාගත හැකිය. නැවත උත්පාදනය නොලැබුවාවූ අය දෙවියන් වහන්සේගේ ශුද්ධකම සැබවින්ම විශ්වාස නොකරති. උන්වහන්සේගේ චරිතය පිළිබඳ ඔවුන්ගේ සංකල්පය මුළුමනින්ම ඒකපාර්ශිකය. උන්වහන්සේගේ දයාව අනිත් සියල්ල අභිබවා යනු ඇතැයි ඔවුහු ආදරයෙන් බලාපොරොත්තු වෙති. **"මේවා නෝ කළෙහිය, මවද නිශ්ශබ්දව සිටියෙමි. මවත් සියළු ආකාරයෙන් තට සමාන යයි සිතුයෙහිය. එහෙත් තට තර්වටු කරන්නෙමි, තාගේ ඇස්හමුයෙහි ඒවා පිළිවෙළින් තබන්නෙමියි කියනසේක."(ගීතාවලිය 50:21)** යනු ඔවුන්ට එරෙහිව දෙවියන් වහන්සේගේ චෝදනාවයි. ඔවුන් සිතන්නේ ඔවුන්ගේ නපුරු හදවත් අනුව හැඩගස්වාගතහැකි දෙවිකෙනෙකු ගැන පමණි. එබැවින් ඔවුන් මෝඩ, අණුවන මාර්ගයක දිගටම ගමන් කරති.

ශුද්ධලියවිල්ලේ දිව්‍ය ස්වාභාවයට සහ චරිතයට ආරෝපනය කර ඇති ශුද්ධකම කොයිතරම්ද කියනවානම්, එය උන්වහන්සේගේ අධිමානුෂීය සම්භවය පෙන්නුම් කරනු ලබයි. පුරාණයේ සහ නූතන මිත්‍යාදෘෂ්ඨික දෙවිවරුන්ට ආරෝපණය කරඇති චරිතය සැබෑ දෙවියන් වහන්සේට අදලවන නිර්මල පාරිශුද්ධත්වයට ප්‍රතිවිරුද්ධව තිබේ. සියළු පාපයන් කෙරෙහි අතිශයින්ම පිළිකුළක් ඇති, විස්තර කළනොහැකි තරම් ශුද්ධ දෙවිකෙනෙකු ආදම්ගේ වැටුණු පරම්පරාවෙන් කිසිවිටෙකත් කිසිවෙක් නිර්මාණය කළේ නැත. කාරණය නම්, මිනිසාගේ හදවතේ ඇති භයානක දුෂ්චරිතය සහ ජීවමාන දෙවියන් වහන්සේට එරෙහිව ඇති ඔහුගේ සතුරුකම අසීමිතව හා නොවෙනස්ව පැවතීමයි. ඔවුන් තුල ශුද්ධ කෙනෙකුවීම සඳහා කිසිවක් ප්‍රකාශවන්නේ නැත. පාපය පිළිබඳ ඔහුගේ අදහස වන්නේද ප්‍රායෝගිකව ලෝකය **"අපරාධය"** ලෙස හඳුන්වන දෙයට සීමාවේ. ඊටවඩා අඩු ඕනෑම දෙයක් මනුෂ්‍යය දෝෂ, වැරදි, දුර්වලතා, ලෙස සමනය කරමින් පාපය උදෙසා නිදහසට කරුණු සහ බරපතලකම ලිහිල්කිරීම ලබාදෙනු ලබයි.

කිතුණුවන් යැයි කියාගන්නා බහුතරයක් දෙවියන් වහන්සේ තමන් ප්‍රේමකරන අයදෙස බලන, නිදහසේ ආශාවන් සපුරා ගැනීමට ඉඩදෙන, තරුණ අවදියේ නොසැලකිලිමත්කමට මෘදුලෙස ඇසිපිය හෙළන මහළු කෙනෙකු ලෙස සළකණු ලබන්නෝය. නුමුත් දේවවචනයේ පවසන්නේ, **"අහංකාරීහු ඔබගේ ඇස් හමුයෙහි නොසිටින්නෝය. අපරාධ ක්‍රියාකරන සියල්ලන්ට ඔබ ද්වේෂකරනසේක." (ගීතාවලිය 5:5) "දෙවියන් වහන්සේ ධර්මිෂ්ඨ විනිශ්චයකාරයෙක, එසේය, සෑවදුව උදහස්වන දෙවිකෙනෙක." (ගීතාවලිය 7:11)** නුමුත් මනුෂ්‍යයා මේ දෙවියන් වහන්සේව විශ්වාසකිරීම ප්‍රතික්ෂේප කරන අතර පාපයට ඇති උන්වහන්සේගේ ද්වේශකිරීම ඔවුන්ගේ අවධානයට යොමුවූවිට දත්මිටිකති. පව්කාර මනුෂ්‍යයාට සදකාලිකවම වධහිංසා කරනුලබන ගිනිවිල නිර්මාණය කිරීම හැර ශුද්ධ දෙවිකෙනෙකු නිර්මාණය කිරීමට හැකියාවක් නැත.

දෙවියන් වහන්සේ ශුද්ධ දෙවියන් වහන්සේ බැවින් මනුෂ්‍යයාගේ නපුරු ක්‍රියාවන් හේතුවෙන් උන්වහන්සේ සමග පිළිගැනීම කිසිසේත්ම සිදුවිය නොහැකි දෙයකි. වැටුණු ජීවියෙකුට අසීමිත පාරිශුද්ධත්වයේ අනුමැතියට සරිලන දෙයක් නිර්මාණය කිරීමට වඩා ඉක්මනින් ලෝකයක් නිර්මාණය කළහැකිය. අන්ධකාරයට ආලෝකය සමග වාසය කළහැකිද? නිර්මල තැනැත්තාට අපිරිසිදු වස්ත්‍රවලින් සැරසිය හැකිද? (යෙසායා 64:6) පව්කාර මනුෂ්‍යයා බිහිකරන හොඳමදේ වුවත් අපිරිසිඳුය. නරක ගසකට හොඳඵල දැරීමට නොහැකිය. දෙවියන් වහන්සේ තමන්වහන්සේ තුල නොමැතිදේ ධර්මිෂ්ඨ සහ ශුද්ධ ලෙස ගණන් ගන්නේ නම් දෙවියන් වහන්සේ තමන්වහන්සේවම ප්‍රතික්ෂේපකර උන්වහන්සේගෙ

4පිටුවට

3 පිටුවෙන්

දෙවියන් වහන්සේගේ ශුද්ධකම...

ම පරිපූර්ණත්වයට අපහාස කරනුඇත. දෙවියන් වහන්සේගේ ස්වාභාවයට අවමවශයෙන්වත් පටහැනි කැලලක් ඇති කිසිවක් උන්වහන්සේ පිළිනොගන්නාසේක. මනුෂ්‍යය වර්ගයාව මුදගත් නිසා යේසුස් වහන්සේගේ නාමයට මහිමයවේවා. පියාණන් වහන්සේගේ ශුද්ධකම ඉල්ලා සිටිදෙය උන්වහන්සේගේ කරුණාවෙන් අපගේ ස්වාමීන් වන ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුල සපයාඇත. රැ කවරණය සඳහා උන්වහන්සේ වෙත පැමිණියාවු සෑම දිළිඳු පව්කාරයෙක්වම ප්‍රේමණීයයාණන් වහන්සේ තුල පිළිගනු ලැබේ. (එපීස 1:6) හාලේලූයියා...!

මනුෂ්‍යයා දෙවියන් වහන්සේ වෙත සමීපවීම.

දෙවියන් වහන්සේ ශුද්ධ බැවින් උන්වහන්සේ වෙත අපගේ ප්‍රකාශවීම් අතිශයින්ම ගෞරවයට පාත්‍රවේ. **“උන්වහන්සේ වනාහී ශුද්ධවන්තයන්ගේ සභාවේදී ඉතා භයානකවූ, තමන් අවට සිටින සියල්ලන්ට වඩා භයවිය යුතුවූ දෙවිකෙනෙක්ය.” (ගීතාවලිය 89:7)** ඊළඟට, **“අපේ දෙවිවූ ස්වාමීන් උසස්කරව්, උන්වහන්සේගේ පාපුටුව වෙත නමස්කාරකරව්, උන්වහන්සේ ශුද්ධසේක.” (ගීතාවලිය 99:5)** “ඔව්”, උන්වහන්සේගේ පාපුටුව ඉදිරියෙහි නිහතමානිකමේ පහළම ඉරියව්වෙන් වැඳ වැටෙන්න. මෝසෙස් ඇවිළෙන ගිනිපඳුර ළඟට පැමිණිවිට දෙවියන් වහන්සේ මෙසේ පැවසූසේක. **“උන්වහන්සේ කථාකොට, මෙතැනට ළංනොවෙව, නුඹේ පාදවලින් නුඹේ වහන් ගළවව. මක්නිසාද නුඹ සිටින ස්ථානය ශුද්ධභූමියකැයි කීසේක.” (නික්මයාම 3:5)** උන්වහන්සේට භයින් සේවය කළයුතුය. **“ස්වාමීන්ට භයින් මෙහෙකරව්, වෙවුලුව් සහිතව ප්‍රීතිවව්.” (ගීතාවලිය 2:11)** ඊශ්‍රායෙල් සම්බන්ධයෙන් උන්වහන්සේ ඉල්ලාසිටියේ, **“මා ළඟට පැමිණෙන්නන් කරුණාකොටගෙන මා විශුද්ධ බව දක්වා වුළු සෙනඟ ඉදිරියෙහි ගෞරව ලබන්නෙමියි ස්වාමීන්වහන්සේ කී කාරණය මේයයි කීවේය,” (ලෙවීකථාව 10:3)** උන්වහන්සේගේ විස්තර කලනොහැකි ශුද්ධකම ගැන අපගේ හදවත් විශ්මයට පත්වන තරමට උන්වහන්සේ වෙත අපගේ ප්‍රවේශයන් වඩාත් පිළිගතහැකිවනු ඇත.

දෙවියන් වහන්සේ ශුද්ධ බැවින් අපි උන්වහන්සේට කැමති ආකාරයට අනුකූලවීමට ආශාකළ යුතුය. **“නුඹළා කෑදවූ තැනැත්වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් නුඹළාත් නුඹළාගේ වුළු හැසිරීමේදී ශුද්ධව සිටපල්ලා. මක්නිසාද මා ශුද්ධව සිටින හෙයින් නුඹළාත් ශුද්ධව සිටිය යුතුයයි ලියා තිබේ.” (1 ප්‍රේතුස් 1:15-16)** “දෙවියන් වහන්සේට ගෞරවකිරීමේ ප්‍රධාන ක්‍රමය මෙයයි. අපි දෙවියන් වහන්සේව මහිමයට පත්කරන්නේ උසස් ප්‍රශංසා මුඛයෙන් ගෞරවකිරීම තුලින් හෝ වාචික ප්‍රකාශ වලින් හෝ උඩඟු ආකාරයකින් උන්වහන්සේට කරන සේවාවකින් නොවේ. නුමුත් අපි නොකැලැල් ආත්මයක් ඇතිව උන්වහන්සේ සමග කථාකිරීමට සහ උන්වහන්සේ මෙන් ජීවත්වීම තුල උන්වහන්සේට සමාන අපේක්ෂාවන් ඇතුව සිටීම තුලිනි.” (එස් චාර්නොක්)

දෙවියන් වහන්සේ පමණක් ශුද්ධකමේ උල්පත වන බැවින් අපි අවංකවම උන්වහන්සේගෙන් ශුද්ධකම සොයමු. අපගේ දිනපතා යාච්ඤාව වියයුතු වන්නේ.., **“සමාදනයේ දෙවියන් වහන්සේව නුඹළා සහමුලින්ම පවිත්‍රකරනසේක්වා. නුඹළාගේ වුළු ආත්මයත්, ප්‍රාණයත්, ශරීරයත්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ඊවේදී නිදොස්ව තිබෙන ලෙස ආරක්ෂාකරනු ලැබේවා.” (1තෙසලෝනික 5:23) යන්නයි.**

ශුද්ධකම ලුහුබැඳීම

(රිවි කාර්මයිකල් විසිනි)

පෙරමග දූතයා සඟරාවේ මෙම කලාපය ශුද්ධකමේ වැදගත් තේමාව කෙරෙහි අවධානය යොමුකරනු ලබයි. ස්වාමීන්වහන්සේට ශුද්ධකමේ කාරණය කොයිතරම් වැදගත්දැයි බයිබල් පද ස්වල්පයකින් පෙන්වාදෙමි.

“නුඹළා කැඳවූ තැනැත්වහන්සේ ශුද්ධව සිටින්නාක් මෙන් නුඹළාත් නුඹළාගේ වුළු හැසිරීමේදී ශුද්ධව සිටපල්ලා. මක්නිසාද මා ශුද්ධව සිටින හෙයින් නුඹළාත් ශුද්ධව සිටියයුතුයයි ලියා තිබේ.” (1 ප්‍රේතුස් 1:15-16)

“සියල්ලන් සමග සමාදනයෙන් සිටින්ටත්, ශුද්ධකම නැතුව කිසිවෙක් ස්වාමීන්වහන්සේ නොදක්නා බැවින් ශුද්ධකම අනුවයන්ටත් උත්සහකරපල්ලා” (හෙබ්‍රෙව් 12:14)

“අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පියවූ දෙවියන් වහන්සේට ප්‍රශංසාවේවා. මක්නිසාද උන්වහන්සේ ඉදිරිපිට ප්‍රේමයෙන් ශුද්ධව, නොකැලැල්ව, සිටින පිණිස, ලෝකය මැවීමට පූර්වයෙන් ක්‍රිස්තුස් වහන්සේ තුළ අප තෝරාගත් ලෙසම, උන්වහන්සේ තුළ ස්වර්ගීය ස්ථානවල සියළු ආත්මික ආශීර්වාද වලින් උන්වහන්සේ අපට ආශීර්වාද කළසේක.”(එපීස 1:3-4)

“පුරුෂයෙනි, ක්‍රිස්තුස් වහන්සේ සභාවට ප්‍රේමකොට, ඇය උදෙසා තමන්ම පාවාදුන්නාක් මෙන්ම, නුඹළාත් නුඹළාගේ භාර්‍යාවන්ට ප්‍රේමකරපල්ලා. එසේකළේ සභාව ශුද්ධව, කැලලක් හෝ රිදී හෝ එබඳු යමක් නැතුව, තේජවත් සභාවක් කොට තමන්ට ඔප්පුකර ගැනීම සඳහා වචනය නැමති වතුරෙන් සේදීමෙන්, උන්වහන්සේ එය පවිත්‍රකොට පිවිසිදුකරන පිණිසය.” (එපීස 5:25-27)

“අප නුඹළාට ප්‍රේමකරන්නාක්මෙන්ම ස්වාමීන්වහන්සේ නුඹළාගෙන් එකිනෙකා කෙරෙහිත් අනික් සියල්ලන් කෙරෙහිත් නුඹළාගේ ප්‍රේමය වැඩිකර, එයින් නුඹළා පුරවා, මෙසේ අපගේ ස්වාමිවූ යේසුස් වහන්සේ තමන්ගේ සියළු ශුද්ධවන්තයන් සමග එනකල නුඹළාගේ සිත් අපගේ පියවූ දෙවියන් වහන්සේ ඉදිරියෙහි ශුද්ධකමින් නිදොස්ව තිබෙන්ට ස්ථිර කරනසේක්වා.” (1 තෙසලෝනික 3:12-13)

“එබැවින්, ප්‍රේමවන්තයෙනි, මේ පොරොන්දු අපට තිබෙන නිසා, මාංශයේද, ආත්මයේද සියළු කිලුටුකව්වලින් අපව පවිත්‍රකරගනිමින්, දෙවියන් වහන්සේ කෙරෙහි භයින් යුක්තව, ශුද්ධකම සම්පූර්ණකරගනිමු.” (2 කොරින්ති 7:1)

අපගේ දෙවියන් වහන්සේ කවුද යන්නට සහ උන්වහන්සේ අපව කැඳවන හා කරන සියල්ලට ශුද්ධකම පැහැදිලිවම අවශ්‍යයවේ. ක්‍රිස්තුස් වහන්සේ අප වෙනුවෙන් තමන්වම පූජාකළ හේතුවටද එය අත්‍යවශ්‍යයවේ. ශුද්ධකම නොමැතිව කිසිවෙකුට ස්වාමීන්වහන්සේව දැකිය නොහැකි බැවින් අපි ශුද්ධකම ලුහුබැඳයාම අත්‍යවශ්‍යයවීමේ සත්‍යතාවය කොයිතරම් වැදගත්ද?

ශුද්ධකමේ අංග

මෙම කලාපයේ ලිපි ශුද්ධකමේ විවිධ අංශ අනාවරණය කරන අතර අපි ස්වාමීන්වහන්සේ සහ උන්වහන්සේගේ අරමුණු සඳහා වෙන්වී, උන්වහන්සේට සම්පූර්ණයෙන්ම කැපවී, උන්වහන්සේගේ ස්වාභාවයෙන් පිරිසිටිය යුතුබව අපට මතක්කරදෙයි. **“නුඹළාගේ ජීවිතයේ පළවූ හැසිරීම ලෙස ඊවට්ල්ලේ තෘෂ්ණාවල් අනුව දුෂ්‍යවන්නාවූ පරණ මනුෂ්‍යයා පහකරදමා, නුඹළා නුඹලාගේ චිත්තාත්මයෙන් අලුත්කරනු ලැබ, සැබෑවේ ධර්මිශ්ඨකමින්ද, ශුද්ධකමින්ද දෙවියන් වහන්සේට සමානව මවනලද්දාවූ අළුත් මනුෂ්‍යයා පැළඳගන්නා ලෙසය.”(එපීස 4:22-24)** ජේ.සී. රයිල් ලියනපරිදි ශුද්ධ මිනිසෙකු දන්නා සෑම පාපයකින්ම වැලකී සිටීමටත්, දන්නාවූ සෑම ආඥාවක්ම පිළිපැදීමටත් උත්සහකරනු ඇත. ඔහුට දෙවියන් වහන්සේ කෙරෙහි ස්ථිර මනසක්, උන්වහන්සේගේ කැමැත්ත කිරීමට හෘදයාංගම ආශාවක්, ලෝකය අප්‍රසාදයට වඩා උන්වහන්සේව අප්‍රසාදයට පත්කිරීමට ඇති භිය සහ උන්වහන්සේගේ සියළු මාර්ග කෙරෙහි ප්‍රේමයක් ඇත.

සැමුවෙල් එල්. බ්‍රෙන්ගල් (1860-1936) ඔහුගේ **“ශුද්ධකමේ මාර්ගය”** නම් පොතේ මෙසේ ලියනු ලැබීය. "ශුද්ධ පුද්ගලයෙක් දෙවියන් වහන්සේ හා සමානයි. නමුත් ඔහු දෙවියන් වහන්සේ මෙන් අසීමිත නොවේ. ඔහු සියල්ල දන්නේ නැත. දෙවියන් වහන්සේට අයිති සියළු බලය සහ ප්‍රඥාව ඔහුට නැත. නමුත් ඔහු ස්වාභාවයෙන්ම දෙවියන් වහන්සේ හා සමානයි. ඔහු යහපත්, නිර්මල, ප්‍රේමණීය, සහ දෙවියන් වහන්සේ මෙන් යුක්ති සහගතය. එසේනම්, ශුද්ධකම යනු දෙවියන්

වහන්සේගේ ස්වාභාවයට අනුකූලවීමයි. එය යේසුස් වහන්සේ තුළ උන්වහන්සේ අනාවරණය කළ පරිදි දෙවියන් වහන්සේට සමානවීමකි.”

ශුද්ධකම සම්බන්ධයෙන් බ්‍රෙන්ගල් තවදුරටත් පෙන්වාදෙන්නේ, යේසුස් වහන්සේ මෙන් ලෝකයේ කොටසක් නොවී අපට කළහැකි සියළු යහපත්දේ කරමින් ලෝකයේ සිටියයුතු බවයි. (යොහාන් 17:16-18) උන්වහන්සේ මෙන් අපි හදවතින් සහ ජීවිතයෙන් නිර්මල වියයුතුය. (1 යොහාන් 3:3) දෙවියන් වහන්සේටත්, සියළු මනුෂ්‍යයන්ටත්, අපගේ සතුරන්ටත්, විශේෂයෙන් ස්වාමීන්වහන්සේ තුල අපගේ සහෝදර සහෝදරියන්ටත් ප්‍රේමයෙන් අපි උන්වහන්සේ මෙන් වියයුතුය. (යොහාන් 13:34) දෙවියන් වහන්සේ අප තුල වාසයකිරීමෙන් අපි යේසුස් වහන්සේ මෙන් වියයුතුය. (යොහාන් 14:11-20) බ්‍රෙන්ගල් සාරාංශ කරන පරිදි ලෝකයෙන් වෙන්වීමේදී, පවිත්‍රතාවයෙන්, ප්‍රේමයෙන්, ආත්මයේ පූර්ණත්වයෙන් අපි යේසුස් වහන්සේ මෙන් වියයුතුය. මෙය ශුද්ධකමයි.

ශුද්ධකමේ උල්පත සහ නිධානය

පැහැදිලිවම අපගේ ජීවිතවල එවැනි ප්‍රේමයක්, ජීවයක්, පූර්ණත්වයක් ඇතිවිය හැකිවන්නේ අපතුල සහ අප තුලින් ක්‍රියාත්මක වන දෙවියන් වහන්සේගේ පැවැත්ම, බලය සහ කරුණාව තුලින් පමණි. ආතර් ඩබ්: පින්ක් අපට මතක්කර දෙන පරිදි, **“දෙවියන් වහන්සේ පමණක් ශුද්ධකමේ උල්පත සහ නිධානයයි.”** නැතහොත් රයිල් පවසන පරිදි, **“ශුද්ධකම පැමිණෙන්නේ ක්‍රිස්තුස් වහන්සේගෙනි.”** එය උන්වහන්සේ සමග ඇති එක්සත්කමේ වැදගත් ප්‍රතිඵලයකි. එය සැබෑ මිදිවැලේ ජීවමාන අත්තක්වීමේ ප්‍රතිඵලයකි.

මේ අනුව අපගේ අඛණ්ඩ යාච්ඤාව වියයුත්තේ, ස්වාමීන්වහන්සේ අපව උන්වහන්සේගෙන් පුරවා අපතුල ක්‍රියාකිරීම සඳහා වන අතර එවිට අපට උන්වහන්සේගේ ශුද්ධකමේ කොටස්කරුවෙක් වියහැකිය. (හෙබ්‍රෙව් 12:10) අපි සෑමවිටම ක්‍රිස්තුස් වහන්සේගෙන් ලැබෙන ධර්මිශ්ඨකම, ශුද්ධකම, මිදීම දෙස බැලිය යුතුය. (1 කොරින්ති 1:30) අපව විශුද්ධකිරීමට සහ සියළු පාපයෙන් අපව පවිත්‍රකිරීමට උන්වහන්සේගේ රුධිරය දෙස බැලිය යුතුය. (හෙබ්‍රෙව් 13 : 12, 1 යොහාන් 1:7) විශුද්ධකරන සහ පවිත්‍රකරන උන්වහන්සේගේ වචනය පැළඳගතයුතුය. (යොහාන් 17:17, එපීස 5:26)

අපි ස්වාමීන්වහන්සේ සහ උන්වහන්සේ අප වෙනුවෙන් ආශාකරන ශුද්ධකම ලුහුබඳිනවිට උන්වහන්සේම අපව සම්පූර්ණයෙන්ම විශුද්ධකරන සේක්වා..! එවිට අපට උන්වහන්සේගේ මහිමය සඳහා සම්පූර්ණයෙන්ම ජීවත් වියහැකිය. (1 තෙසලෝනික 5:23, 1 ප්‍රේතුස් 2:9)

“ඔවුන් අතරේ නුඹළා ජීවනයේ වචනය පාමින් ආලෝකවල් මෙන් ලෝකයෙහි දක්නා ලබන්නහුය.” (පිලිප්පි 2:15)

පාපය සමග සුළු කොටසක්වත් නොවිය යුතුය

දෙවියන් වහන්සේගේ දයාව හැර අන්කිසිවක් නොමැති බව පෙනෙනතෙක් දෙවියන් වහන්සේගේ දයාව ගැන දේශනාකල දේශකයෙකු ගැන මම මෑතකදී කියෙව්වෙමි. නමුත් ඔහු දෙවියන් වහන්සේව වැරදි ලෙස නිරූපණය කලාකියා මම හියවෙනවා. එවැනි වැරදි නිරූපණයක් පහසුයි. ගැඹුරින් නොසිතන සහ ජීවිතය බැරෑරුම් ලෙස ගැනීමට අකමැති අයට එය ප්‍රසන්නයි. නමුත් එය කිවනොහැකි තරම් භයානකයි.

අපි ආත්ම දිනාගැනීමට සහ අපගේම අයව බේරාගැනීමට නම් අප අල්ලා ගෙන සිටින දෙවියන් වහන්සේගේ චරිතයේ චිත්‍රය විකෘති නොකළයුතුයි. දෙවියන් වහන්සේව සහ උන්වහන්සේ එවූ ක්‍රිස්තුස් වහන්සේව ඇඳිනගැනීම සදකාලික ජීවිතයයි. (යොහාන් 17:3) නමුත් එය උන්වහන්සේ සිටින ආකාරයටම සැබෑ සහ ශුද්ධවූ දෙවියන් වහන්සේ වියයුතු අතර අපගේ දිළිඳු, කුඩා, විකෘති, මිනිස් ආශාවන් සහ මතයන්ට අනුකූල වන යම්ආකාරයක බොරු දෙවියෙකු නොවිය යුතුය.

සමහර ආගමික ගුරුවරුන් දෙවියන් වහන්සේව සම්පූර්ණයෙන්ම මිලේච්ඡ හා කුරිරු ලෙස නිරූපණය කරමින් උන්වහන්සේ ගැන වැරදි ආකාරයට නිරූපණය කරන අතර ඔවුන් නිරයේ වචන වලින් නිවනොහැකි තරම් භයානක පින්තූර ගැන ප්‍රීතිවෙති. එහිදී ශාපලත් (දෙවියන් වහන්සේගෙන් ඈත්වගිය) අය විඳින වදවේදනා වලින් උන්වහන්සේ සතුටු වන බව ඔවුන් සිතින් මවාගන්නෝය. එබැවින් දෙවියන් වහන්සේගේ දයාව පිළිබඳ බලාපොරොත්තුවක් නොමැති බව ඔවුන්ට හැඟෙන නිසා මනුෂ්‍යයන් දෙවියන් වහන්සේට විරුද්ධව කෝපයට පත්වෙති.

තවත් සමහරු දෙවියන් වහන්සේව වැරදියට නිරූපණය කරන්නේ පව්කාරයන් කෙරෙහි අනවශ්‍ය අනුකම්පාවෙන් පොළඹවන සහ ලෝකවාසීන් සුළුපටු අය සහ ඇල්මැරුණු මහාචාර්‍යවරුන් ලෙස දුර්වල, හැඟීම්බර, සහ අනුකම්පාවෙන් බලන යහපත් දෙවිකෙනෙකු ලෙස පෙනීසිටීමට සැලැස්වීමෙනි. දෙවියන් වහන්සේ පිළිබඳ සත්‍යතාවයට වඩා තවත් දෙයක් නොමැත.

පාපයේ ජීවත් වෙමින් තම මාර්ග පිළිනොගන්නා බව සිතූ අයට දෙවියන් වහන්සේ දැඩිලෙස තරවටු කරනබව අපට පෙනෙන්නේය. උන්වහන්සේ ඔවුන්ගේ පාප ලැයිස්තුවක් ඔවුන් ඉදිරියේ තබයි. (ගීතාවලිය 50:17-20) ඉන්පසුව මෙසේ කියනසේක. **“මේවා නෝ කෙළෙහිය, මවද නිශ්ශබ්දව සිටියෙමි. මවත් සියළු ආකාරයෙන් තට සමානයයි සිතූයෙහිය. එහෙත් තට තරවටු කරන්නෙමි, තාගේ ඇස් හමුයෙහි ඒවා පිළිවෙළින් තබන්නෙමියි කියනසේක. දෙවියන් වහන්සේ සිහිනැති කරන්නෙනි, මා විසින් ඉරනු නොලබන පිණිසත්, ගළවන්ට කෙනෙක් නැතිනොවන පිණිසත් මෙය කල්පනාකරව්.” (ගීතාවලිය 50:21-22)**

සත්‍යය මෙම අන්තයන් අතර පවතී. දෙවියන් වහන්සේ තුල දයාව ඇත. නමුත් එය සැරබව සමග මිශ්‍රව පවතියි. දෙවියන් වහන්සේ තුල උදහස ඇත. නමුත් එය දයාවෙන්, සංයමයෙන් යුක්තවේ. බයිබල් කාලයේ සිට මේදක්වා ශ්‍රේෂ්ඨලෙස ආත්මදිනාගත් අය මෙය හඳුනාගෙන ඇත. ඔවුන් දෙවියන් වහන්සේගේ යහපත්කම සහ සැරකම අතර ඒකාකාර සමතුලිතතාවයක් පවත්වාගෙන ගොස් ඇත. මන්ද බයිබලයේ එසේකර ඇත. ලියාඇති ගනන්කළ නොහැකි තරම් පොත් අතරින් දෙවියන් වහන්සේගේ බලය ඇති නිරූපණයක් අපට ලබාදෙන එකම පොත බයිබලයයි.

ශුද්ධ ලියවිල්ල අපට අනතුරු අඟවයි

සොබාදහමේ පොත දෙවියන් වහන්සේගේ යහපත්කම සහ සැරකම අපට හෙළිදරව් කරයි. ගින්න අපගේ ආහාර පිසගැනීමට අපට උපකාර කරනවා පමණක් නොව, එය සියල්ල දවාදමනු ලැබීමටද පුළුවන. ජලය අපගේ පිපාසය සන්සිඳුවා අපව ප්‍රබෝධමත් කරනවා පමණක්නොව, අප එය සුළුකොට සැලකුවොත් අපව එයින් යටකර (ගිල්ලවා) දැමීමටද පුළුවන. සොබාදහමේ ක්‍රියාත්මක වන දෙවියන් වහන්සේගේ ක්‍රම අපි හඳුනාගෙන අවධානයෙන් යුතුව කීකරුවුවහොත් සොබාදහමේ නීති වඩාත් කරුණාවන්ත සහ ප්‍රයෝජනවත් බවක් අපට පෙනෙනු ඇත. නුමුත් අපි නොසලකා හැරියොත් සහ ඊට කිකරු නොවුවහොත් අපට ඒවා වඩාත් විනාශකාරී සහ භයානක බව පෙනෙනුඇත.

ශුද්ධ ලියවිල්ල අපට අනතුරු අඟවයි

දෙවියන් වහන්සේගේ චරිතයේ සියළු පොහෙසත්කම සහ උන්වහන්සේ තමන්වහන්සේවම එළිදරව් කිරීමේ මුළු පූර්ණත්වය අපට දැනගැනීමට අවශ්‍යය නම්, අපි බයිබලය අධ්‍යනයකර ශුද්ධලියවිල්ල, ශුද්ධලියවිල්ල සමගම සන්සන්දනය කළයුතුය. දෙවියන්වහන්සේගේ කිවනොහැකි ප්‍රේමය උන්වහන්සේගේ වචනය වන බයිබලය අපට පෙන්වා දෙනුලබයි. උන්වහන්සේගේ දයාව තුල පව්කාරයන්ව සොයනුලබයි. නුමුත් උන්වහන්සේගේ ධර්මිශ්ඨකමට අවශ්‍යයවන්නේ පව්කාරයන්ගේ පසුතැවිලිවීම, ඇදහිල්ල, නපුරෙන් වෙන්වීම සහ උන්වහන්සේගේ කැමැත්තට කීකරුවීමයි. දෙවියන් වහන්සේ තම දයාව සහ විනිශ්චයන් අතර සමබරතාවයක් පවත්වා ගන්නා ආකාරය බයිබලයේ සිදුවීම්වලින් පෙන්නුම් කරනුලබයි.

එබැවින් දෙවියන් වහන්සේගේ යහපත්කම සහ සැරකම බලන්න. පාවුල්තුමා මෙසේ ලියනු ලැබීය, **“එබැවින් දෙවියන් වහන්සේගේ යහපත්කමත් සැරකමත් බලාපන්න. වැටුණුවුන් කෙරෙහි සැරකමය. නුමුත් නුඹ උන්වහන්සේගේ යහපත්කමෙහි පවතින්නෙහි නම්, නුඹ කෙරෙහි දෙවියන් වහන්සේගේ යහපත්කමය. එසේ නොපවතින්නෙහි නම්, නුඹත් කපාදමනු ලබන්නෙහිය. ඔවුහුද අවිශ්වාසකමෙහි නොපවතින් නම් පාස්සනු ලබන්නෝය. එක්නිසාද ඔවුන් නැවත පාස්සන්ට දෙවියන් වහන්සේට පුළුවන.” (රෝම 11:22-23)** දෙවියන් වහන්සේ උන්වහන්සේගේ දැඩිකමේදී පවා දයාව පෙන්වීමට බලාසිටින ආකාරය පැහැදිලි කරනුලබයි.

නැවතත් පාවුල්තුමා මෙසේ ලියන්නේය, **“එක්නිසාද වම සුභාරංචිය ගැන ලැජ්ජානොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය දෙවියන් වහන්සේගේ බලයව තිබෙනනිසාය. කුවක්හෙයින්ද ධර්මිශ්ඨයා අදහිල්ලෙන් ජීවත්වේයයි ලියාතිබෙන ලෙස අදහීමෙන් පැමිණෙන දෙවියන් වහන්සේගේ ධර්මිශ්ඨකම අදහීම පිණිස එහි එළිදරව්වී තිබේ. එක්නිසාද සත්‍යය අධර්මිශ්ඨකමින් වලක්වන්නාවූ මනුෂ්‍යයන්ගේ සියළු අභක්තියටද, අධර්මිශ්ඨකමටද විරුද්ධව දෙවියන් වහන්සේගේ උදහස ස්වර්ගයෙන් එළිදරව්වී තිබේ.”(රෝම 1:16-18)**

පාවුල්තුමා මෙලෙසින්ද ලියාඇත. **“නොහොත් නුඹ පසුතැවිල්ලට පමුණුවන පිණිස දෙවියන් වහන්සේගේ යහපත්කම පවතින බව නොදැන, උන්වහන්සේගේ යහපත්කමේද, ඉවසීමේද බහුලත්වය සුළුකොට සිතා, නුඹේ සිතේ මුර්ඛකමෙන්ද, පසුතැවිලි නොවන සිතින්ද දෙවියන් වහන්සේගේ ධර්මිශ්ඨවූ විනිශ්චය එළිදරව්වන උදහසේ දවසට නුඹ උදහස රැස්කර ගන්නෙහිද? උන්වහන්සේ සියළු මනුෂ්‍යයන්ට තමතමුන්ගේ ක්‍රියාලෙස විපාකදී, ඉවසිම ඇතුව යහපත්කම් කිරීමෙන් මහිමයද, ගෞරවයද, අවභාෂාවයද, සොයන්නන්ට සදකාල ජීවනය දෙනසේක. නුමුත් සැබෑකමට අකීකරුවූ, අධර්මිශ්ඨකමට කීකරුවූ විරුද්ධවාදීන්ට උදහස සහ තදකෝපයත්, නපුරුකම්කරන සියළු මනුෂ්‍යය ආත්ම -වලට, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, පීඩාව හා සිත් වේදනාවත් පැමිණෙන්නේය. නුමුත් යහපත්කම් කරන්නාවූ සියළු මනුෂ්‍යයන්ට එනම් පළමුකොට යුදෙව්වාටද, එසේම ග්‍රීකයාටද, මහිමයත්, ගෞරවයත්, සමාදානයත් ලැබෙන්නේය. එක්නිසාද දෙවියන් වහන්සේ තරාතිරම් නොබලනසේක.” (රෝම 2:4-11)**

ශුද්ධලියවිල්ලෙහි එළිදරව් කරඇති දෙවියන් වහන්සේගේ ගැළවීමේ දයාව ගැඹුරු මුහුදට එරෙහිව මහා කඳු පිහිටුවා ඇති ආකාරයටම දෙවියන් වහන්සේගේ උදහසට එරෙහිව නිරන්තරයෙන් තබා තිබේ. හෙබ්‍රෙව් යැවුම් පත්‍රය ලියනුලැබූ ලේඛකයා

(සැමුවෙල් එල්. බ්‍රෙන්ගල් විසිනි) (1860-1936)

යේසුස් වහන්සේ ගැන මෙසේ පවසයි. **“එබැවින් උන්වහන්සේ කරුණාකොටගෙන දෙවියන් වහන්සේ වෙතට ළඟාවෙන්නන් උදෙසා සැදහත්කම් කරන පිණිස උන්වහන්සේ නිරන්තරවම ජීවත්වන හෙයින් ඔවුන් කෙළවර දක්වාම ගළවන්ට උන්වහන්සේට පුළුවන.”(හෙබ්‍රෙව් 7:25)** උදහසට ලක්වූ සමහරුන් ගැන පාවුල් මෙසේ ලියාඇත. **“අන්‍යජාතීන් ගැළවෙන පිණිස ඔවුන්ට කථාකිරීම අපට තහනම් කරති. මෙසේ ඔවුහු නිතරම තමුන්ගේ පව් සම්පූර්ණ කරති. උදහස තීන්දුවටම ඔවුන් කෙරෙහි පැමිණිනිබේ.” (1 තෙසලෝනික 2:16)**

එමනිසා විශ්වාසකර කීකරුවෙන සියල්ලන්ට අතිශයින්ම ගැළවීමක් ඇති අතර ආත්මාර්ථකාමී අවිශ්වාසයෙන්, ලෞකීකත්වයෙන් හා පාපයෙන් ඉදිරියට යන සියල්ලන්ටම අතීශයින් දුක් වේදනා ඇත. සැබවින්ම දෙවියන් වහන්සේ විනිශ්චයේ දෙවියන් වහන්සේ බැවින් උන්වහන්සේට සරදම්කිරීමට කිසිවෙකුට නුපුළුවන. **“දෙවියන් වහන්සේට සරදම් කරන්ට කාටවත් බැරිය. එක්නිසාද මනුෂ්‍යයෙක් තමා වපුරනදේම කපාගන්නේය.” (ගලාති 6:7)**

යේසුස් වහන්සේ අපට අනතුරු අඟවනසේක

යේසුස් වහන්සේ මෙය පවසනවිට සමබරව තබාගන්නා බව අපට පෙනෙන්නේය. උන්වහන්සේගේ වචන අසා ඒවා පිළිපදින්නන් වර්ෂාව, ගංවතුර සහ සුළඟට ජයගැනීමට නොහැකිවනසේ පර්වතය මත ගොඩනගන අය බවත්, උන්වහන්සේගේ වචනය අසා කීකරුනොවන අය වැස්ස, ගංවතුර,සහ සුළඟින් ගසාගෙන යන වැලි මත ගොඩනගන්නන් බවත් පැවසූසේක. (මතෙව් 7:24-27) නැවතත් දුෂ්ඨයන් සදකාලික දඬුවමට යන්නේය නමුත් ධර්මිශ්ඨයන් සදකාලික ජීවනයටත් යන්නේයයි පැවසූසේක. (මතෙව් 25:46)

යේසුස් වහන්සේ විවාහ මංගල්‍යයට කැඳවනු ලැබූවන් ඇතුලත සිටිද්දී වසාදැමූ දොරටුව ගැන කථාකළසේක. ධර්මිශ්ඨයන් තම ස්වාමියා සමග ඇතුලත සිටින අතර ප්‍රතික්ෂේප කරනු ලැබුඅය පිටත සිටිති. යහපත් සහ විශ්වාසවන්ත සේවකයන් ඔවුන්ගේ ස්වාමියාගේ ප්‍රීතියට ඇතුල්වන අතර දුෂ්ඨයන් සහ අලසයන් පිටත අන්ධකාරයට හෙළනු ලබයි. සමහරුන් සැනසිල්ලේ ආරක්ෂාවේ සහ සාමයේ ළයතුල දකුණු පැත්තේ සිටින අතර සමහරුන් දරුණු වධහිංසාවේ කටුක දුක්ඛිත තත්වයේ වැරදි පැත්තේ සිටියි. යොහාන්තුමා මෙම මහත්වූ සත්‍යතාවය විශ්වාසවන්තව අපට පෙන්වාදී තිබේ. ඔහු මොරගසමින් මෙසේ කියයි. **“පුත්‍රයාණන් කෙරෙහි අදහන්නාට සදකාල ජීවනය ඇත. නුමුත් පුත්‍රයාණන්ට කීකරු නොවන්නා ජීවනය නොදක්නේය, දෙවියන් වහන්සෙගේ උදහස ඔහු කෙරෙහි පවතියි.” (යොහාන් 3:36)**

එලෙසම පරණ ගිවිසුම පුරාම මෙම ඒකාකාර සමතුලිතබව පවත්වාගෙන යනු ලැබේ.**“නුඹළාගේ අත් ලෙයින් පිරිතිබේ. නුඹළා සෝදාගෙන පවිත්‍ර වෙයල්ලා. නුඹළාගේ ක්‍රියාවල නපුරුකම මාගේ ඇස් ඉදිරියෙන් පහකර නපුරුකම් කිරීමෙන් වැළකියල්ලා. යහපත්කම් කරන්ට ඉගෙනගනිල්ලා. යුක්තිය සොයා, බලාත්කාරය මැඩපවත්වාපල්ලා, වවුපියන් නැත්තාට යුක්තියකර, වැන්දඹුවගේ නඩුව අසාපල්ලා. ඉනින් වරෙල්ලා, අපි කාරණා කථාකරගනිමුයයි ස්වාමීන් වහන්සේ කියනසේක. නුඹළාගේ පව් රතුපාට වෙන් තිබෙන නුමුත් ඒවා හිමවෙන් සුදුවන්නේය. ඒවා ලාක්ෂාවෙන් රතුව තිබෙන නමුත් සුදු ලොව් වෙන් වන්නේය. නුඹළා කැමතිව කීකරුවෙන්නහු නම් දේශයේ සාරවත්කම භුක්තිවිඳින්නහුය. නුඹළා අකීකරුව කැරලිගසන්නහු නම්, කඩුවෙන් මැරුවිකන්නහුය. එක්නිසාද ස්වාමීන්වහන්සේගේ වුඛය එය වදාළසේක.”(යෙසායා 1:16-20)** මෙම බයිබල් වචනවල අපට පෙන්වන්නේ දෙවියන්

6 පිටුවට

5 පිටුවෙන්

පාපය සමග සුළු කොටසක්ව...

වහන්සේ දයාවන්තය යන මිහිරි වචන පමණක් නොව දෙවියන් වහන්සේගේ පොහොසත් බව සහ උන්වහන්සේගේ බහුවිධ චරිතය සාරාංශකර පෙන්වයි. බයිබලය අපට පවසන්නේ දෙවියන් වහන්සේ ප්‍රේමය බවයි. **“ප්‍රේමනොකරන්නා දෙවියන් වහන්සේව නාඳුනයි. මක්නිසාද දෙවියන් වහන්සේ ප්‍රේමයය.”** (1 **යොහාන් 4:8**) එමෙන්ම උන්වහන්සේ ගින්නක් බවත් පවසන්නේය. **“මක්නිසාද අපගේ දෙවියන් වහන්සේ විනාශකාරන ගින්නක්ය.”** (**හෙබ්‍රෙව් 12:29**)

යේසුස් වහන්සේ කෙරෙහි විශ්වාසය තබා පසුතැවිලිවෙන හදවත් ඇති අයට දෙවියන් වහන්සේ දයාවෙන් පොහොසත් බව සොයාගත හැකිය. නුමුත් ආඩම්බරයෙන්, නොසැලකිලිමත් ලෙස හෝ දුෂ්ඨලෙස තමන්ගේ මාර්ගවල ගමනකරන අයට එරෙහිව උපරිම දඬුවම් ලබාදීමෙන් උන්වහන්සේ තම විශ්වයේ සදාචාරාත්මක සහ අධ්‍යාත්මික පිළිවෙළ ආරක්ෂා කරනසේක. අපගේ එකම බලාපොරොත්තුව යේසුස් වහන්සේගේ තුවාල සහ රුධිරයේ සෙවනයි. එහිදී පමණක් අපට දයාව සොයාගත හැකිය. මක්නිසාද අපි පව්කර ඇත්තෙමු. නුමුත් එහිදී දයාව අසීමිතව හා නොමිලේ ලබාගත හැකිය. හාලේලූයියා...!

පාපයේ අතීශය බරපතලකම

මෝඩයෝ පාපයට සරදම් කරති කියා සාලමොන් ලිවීය. (හිතෝපදේශ 14:9) ප්‍රඥාවන්තයැයි කියාගන්නාවූ මනුෂ්‍යයන් සාමාන්‍යය මනුෂ්‍යයාව නොමගයවමින් සර්පයා ඒවට රැවැට්ටුවාක් මෙන් රවටමින් සිටිති. **“සර්පයාද නුඹළා ඇත්තටම නසින්නේ නැත.”** (**උත්පත්ති 3:4**) නුමුත් දෙවියන් වහන්සේගේ චරිතයේ සහ නීතියේ (ව්‍යවස්ථාවේ) වෙනස් නොවන ශුද්ධකම තේරුම්ගන්නාවූ මනුෂ්‍යයන් පාපය ගැන සිතනවිට උන්වහන්සේ ඉදිරියේ භයෙන් වෙව්ලති. දෙවියන් වහන්සේට භයවියයුතු බව ඔවුන් දනිති. දේවභය ඔවුන් ඉදිරියේ ඇත. මෙය භයදුරුකරන පරිපූර්ණ ප්‍රේමයට පටහැනි නොවේ. ඒ වෙනුවට එය එම ප්‍රේමය සමග වෙන්කළ නොහැකි ලෙස සම්බන්ධවී ඇති අතර එම ප්‍රේමය වඩාත් පූර්ණ ලෙස හිමිකරගත් මනුෂ්‍යයා වඩාත්ම භයවන්නේ පාපයෙන් ඉවත්වීමට මගපෙන්වන එම ගෞරවණීය භියෙන් යුතුවය. යේසුස් ක්‍රිස්තුස් වහන්සේ තුල දිව්‍ය ප්‍රේමයේ සහ සහයෝගීතාවයේ ශ්‍රේෂ්ඨතම උසට උසස්කරනලද තැනැත්තේ පාපයට එරෙහිව ඉක්මනින් සිදුවීමට නියමිත ක්‍රිස්තුස් වහන්සේගේ දිව්‍ය කෝපයේ භයානක ගැඹුර සහ පව්කාරයන් පිටතට යන පතුලක් නැති වල ඉතා පැහැදිලිව දකින්නෝය.

පාපයේ අධික පාපකාරී බව සහ දුෂ්ඨකමට එරෙහි දෙවියන් වහන්සේගේ උදහස පිළිබඳව මෙම දර්ශනය සහ හැගීම ආදම් සහ ඒව ඒදන් උයනේ ගස් අතර සැඟවීසිටියාක් මෙන් මනුෂ්‍යයෙකුව දෙවියන් වහන්සේගෙන් සැඟවීමට සලස්වන භීතිකාවයි. වහල් භියක් නොව ආත්මයේ එළිමහනට පැමිණ දෙවියන් වහන්සේ වෙත දිවගොස් උන්වහන්සේගේ දැතින් රැකවරණය සොයමින් සිටීමයි. **“පසුවදා, ඔහු තමා ළඟට යේසුස් වහන්සේ එනවා දැක කථාකොට, අන්න ලෝකයේ පාපය දුරුකරන දෙවියන් වහන්සේගේ බැටළු පැටියාණෙනේ.”** (**යොහාන් 1:29**) යැයි කීවේය.

ක්‍රිස්තුස් වහන්සේ තුලින් විශුද්ධ කිරීම

(ඔක්ටේවියස් වින්ස්ලෝ විසිනි) (1808-1878)

විශුද්ධකරණයට, ක්‍රිස්තුස් වහන්සේගේ සමානත්වයට වැඩෙන සමානකමක් ඇතුලත්වේ. ශුද්ධාත්මයාණන් වහන්සේ මෙය උන්වහන්සේගේ වචනයෙන් කොයිතරම් අලංකාරව පැහැදිලි කර තිබෙනසේක්ද? මෙය අපගේ ආදරණීය ස්වාමීන්වහන්සේගේ අනුශාසනාවයි. **“වම සිතින් වෘතුව යටහත්ව සිටින බැවින්, මාගේ වියගහ නුඹළා පිටටගෙන, මාගෙන් ඉගෙනගනිල්ලා. එවිට නුඹළාගේ ආත්මවලට සහනය ලැබෙන්නේය.”**(**මතෙව් 11:29**) එමෙන්ම උන්වහන්සේගේ ගෝලයන්ගේ (ප්‍රේරිතයන්ගේ) ලේඛණ පුරාවටම එම සත්‍යතාවය ප්‍රදර්ශණයවේ. **“මක්නිසාද උන්වහන්සේ සූර්වයෙන් ඇඳිනගත්තවුන් තමන්වහන්සේගේ පුත්‍රයා බොහෝ සහෝදරයන් අතරේ කුළුඳුළා වන පිණිස ඒ පුත්‍රයාගේ ස්වරූපයට සමානවෙන්ට සූර්වයෙන් නියමකළසේක.”**(**රෝම 8:29**) “ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථාකරමින්, හිසව සිටින ක්‍රිස්තුස් වහන්සේ උදෙසා සියළු දේවලදී වැඩෙන පිණිසත්ය.” (එපීස 4:15)

දෙවියන් වහන්සේගේ දරුවෙකුගේ මහිමාන්විත රටාව මෙන්න, විශුද්ධකරණය යනු ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිරූපයට හා ආදර්ශයට අනුකූලවීමයි. ඇදහිලිවන්තයා යේසුස් වහන්සේ මෙන් වැඩෙනතරමට ඔහු ශුද්ධකමෙන් වැඩෙයි. ක්‍රිස්තුස් වහන්සේගේ ප්‍රතිපත්ති වලට සමානවීමට පටහැනිව, මනසෙහි පුරුදු, පුද්ගලයාගේ ආත්මයේ තත්වය, ඔහුගේ කෝපය, දෛනික සෑම ක්‍රියාවකින්ම, බැල්මකින්ම, උන්වහන්සේට සමානවීම අඩුවන තරමට ඔහු ශුද්ධකමේ කාර්‍ය්‍යයේ ඉදිරියටයාම අඩුවේ.

අපගේ ආදරණීය ස්වාමීන්වහන්සේගේ ස්වරූපය දෙස බලන්න. එය කොයිතරම් යටහත් පහත්ද? කොයිතරම් ශුද්ධද? උන්වහන්සේගේ හදවතේ යටහත් පහත්කම, හැසිරීමේ නිහතමානීකම, මෘදුමොළොක් බව, තුවාලවලට සමාවදීම, තමන්වම ප්‍රතික්ෂේපකිරීම, යාච්ඤාකිරීම, තම පියාණන්ගේ මහිමය සඳහා ජ්වලිතව සිටීම, මනුෂ්‍යයාගේ ගැළවීම සඳහා ඇති ආශාව, ආදී කාරණා දෙස බලන්න. යේසුස් වහන්සේ මෙන්වීමට, සියළු දේවලදී උන්වහන්සේ තුල වැඩීමට, සියල්ලෙන් ස්වාමීන්වහන්සේව ප්‍රසන්න කරමින්, ස්වාමීන්වහන්සේට සුදුසු ලෙස ගමන්කළ යුතුය.(කොලොස්සි 1:10-12) අපගේ විශුද්ධකරණය ඉටුකරගැනීම දෙවියන්වහන්සේගේ කැමැත්තයි. (1 තෙසලෝනික 4:3) එමනිසා ඉදිරියට යන ඇදහිලිවන්තයෙකු ක්‍රිස්තුස් වහන්සේගේ සවරූපයට හා ආදර්ශයට සමානත්වයකින් හා අනුකූලතාවයකින් වර්ධනයවන අයෙකු බව අමතක නොකළයුතුය.

ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය

ක්‍රිස්තුස් වහන්සේ වරක් තම ගෝලයන්ට කථාකළ වචන සහ දැන් ඔබට කථාකරන වචන කෙරෙහි අවධානය යොමුකරන්න. **“මිදිවැල මමය, නුඹළා අතුය. යමෙක් මා තුළ පවතින්නේද, මම ඔහු තුළෙහි පවතිමිද, ඒ තැනැත්තේ බොහෝ ඵලදෘයි. මක්නිසාද මාගෙන් වෙන්ව කිසිවක් කරන්ට නුඹළාට බැරිය.”**(**යොහාන් 15:5**) තමාවම විශ්වාසකිරීම, තමාවම සතුටුකිරීම, තමාගැන පුරසාරම් දෙඩවීම යන සියල්ල කුරුසියේ ඇණගැසිය යුතුය. ක්‍රිස්තුස් වහන්සේ තුල ඇති ශක්තියෙන් පමණක් ශක්තිමත් වෙමින් ඇදහිලිවන්තයා සේවය සඳහා යොමුවිය යුතුය. අපගේ ප්‍රඥාව වන්නේ අපගේ දුර්වලකම සහ මෝඩකම තුල යේසුස් වහන්සේ වෙතට යාමයි. අපගේ ජයග්‍රහනයේ රහස මෙයයි. **“එහෙයින් ක්‍රිස්තුස් වහන්සේ උදෙසා පැවිණෙන දුර්වලකම්වලටත්, අන්තරායවලටත්, හිඟකම්වලටත්, පීඩාවලටත්, විපත්තිවලටත්, ප්‍රසන්නව සිටිමි. මක්නිසාද මම දුර්වලව සිටිනකලම ශක්තිමත්ව සිටිමි.”** (2 **කොරින්ති 12:10**) **“උන්වහන්සේද මාගේ කරුණාව නුඹට සෑහේය. මක්නිසාද දුර්වලකමේදී මාගේ බලය සම්පූර්ණ වන්නේයයි මට කීසේක. එබැවින් ක්‍රිස්තුස් වහන්සේගේ ශක්තිය මා කෙරෙහි පිහිටන පිණිස මාගේ දුර්වලකම් ගැන ඉතා සන්තෝෂයෙන් පාර්ථිතු කරන්නෙමි.”** (**2 කොරින්ති 12: 9**) **“මා බලවත් කරන්නාවූ තැනැත්තාවහන්සේ තුළ මට සියළුදේ කරන්ට පුළුවන.”** (**පිලිප්පි 4:13**)

ක්‍රිස්තුස් වහන්සේගේ වචනය

දෙවියන් වහන්සේගේ වචනය විශුද්ධකිරීමේ ශ්‍රේෂ්ඨ මෙවලම බව අමතක නොකරන්න. **“සත්‍යයතාවයෙන් ඔවුන් පවිත්‍රකළවැනව. ඔබගේ වචනය සත්‍යයතාවය.”**(**යොහාන් 17:17**) දෙවියන් වහන්සේගේ සත්‍යය එය තුල ඇත. එය ශුද්ධාත්ම -යාණන් වහන්සේගේ බලයෙන් ආත්මයතුලට ගෙනඑන සෑමවිටදීම විශුද්ධකරනු ලබයි. එමනිසා, **“ක්‍රිස්තුස් වහන්සේගේ වචනය නුඹළාතුළ සවෘද්ධව වාසයකෙරේවා. නුඹළා ගීතිකාවලින්ද, කවිවලින්ද, ආත්මික ගීවලින්ද, එකිනෙකාට උගන්වමින්, දැනවුතුකම් දෙමින්, නුඹළාගේ සිත්වල අනුග්‍රහය ඇතුව දෙවියන් වහන්සේට ගීතිකා කරපල්ලා”** (**කොලොස්සි 3:16**) දෙවියන් වහන්සේගේ වචනය කඩිසරව හා යාච්ඤාවෙන් පූර්ණව ඉගෙනගන්න.

ක්‍රිස්තුස් වහන්සේගේ රුධිරය

යේසුස් වහන්සේගේ පව්කමාකිරීමේ රුධිරය සමග බෝහෝසෙයින් සහ සමීපව කටයුතු කරන්න. පාපයේ බලය තුල වාසයකිරීමට එරෙහිව ජයග්‍රහනයක් නැත. පාපයේ වරදට සමාවක් නැත. නුමුත් ආත්මය ක්‍රිස්තුස් වහන්සේගේ රුධිරය සමග කටයුතු කරන ආකාරයටම අපගේ ආදරණීය ස්වාමීන්වහන්සේගේ මරණයේ ශ්‍රේෂ්ඨ අවසානය වූයේ යක්ෂයාගේ ක්‍රියා විනාශකිරීමයි. පාපය යනු සාතන්ගේ මහත්වූ ක්‍රියාවයි. එය ජයගැනීමට, එහි බලය බිඳදැමීමට, එහි ආධිපත්‍යය යටත්කරගැනීමට, එය හෙළාදකිමින් නිදහස්කිරීමට දෙවියන් වහන්සේගේ ආශිර්වාදලත් පුත්‍රයා කුරුසියේ නින්දිත මරණයට මුහුණදුන්සේක. උන්වහන්සේ විඳදරාගත් ඒ කටුක වේදනා, ඒ මානසික දුක්වේදනා, ගෙත්සෙමන උයනේදී උන්වහන්සේගේ ආත්මයේ දුක, කුරුසියේදී උන්වහන්සේගේ ශාරීරික වේදනා යන සියල්ල පාපය දුරාගැනීම උදෙසා වූසේක. **“උන්වහන්සේ සියළු අධර්මිෂ්ඨකම් වලින් අප මුදා, යහපත් ක්‍රියාගැන ජ්වලිතවූ සෙනගක් ස්වකීය සම්පතක් කොට පවිත්‍රකරගන්න පිණිස, අප උදෙසා තමන්ව දුන්සේක.”** (**තීතස් 2:14**)

එසේනම් ක්‍රිස්තුස් වහන්සේගේ මරණය සහ පාපයේ මරණය අතර සමීප සහ අලංකාර සම්බන්ධය බලන්න. සියළු සැබෑ විශුද්ධකරණය කුරුසිය හරහා පැමිණේ සදකාල ආත්මයාණන් වහන්සේ විසින් ඔබේ ආත්මයට ගෙනඑන ලද කුරුසිය ඔබගේ පාපවල මරණය වනුඇත. යේසුස් වහන්සේගේ කුරුසිය වෙතට යන්න. ඇදහිල්ලේ චාම්බවින් යන්න. වරදකාරීත්වයේ බරින් කුරුසියට යන්න. ඔබට එහි ආදරය හැර වෙනකිසිවක් සොයාගත නොහැකිවනුඇත. එහි පිළිගැනීම හැර අන් කිසිවක්නැත. එහි පාරිශුද්ධත්වය හැර අන්කිසිවක් නැත. **“...,යේසුස් වහන්සේගේ ලේද සියළු පාපවලින් අප පවිත්‍රකරන්නේය.”**(1 **යොහාන් 1:7**) යේසුස් වහන්සේගේ වටිනා රුධිරය මත ඔබ කුරුසියේ යටහත්පහත්ව සිටියදී සතුරා ඔබ වෙත ළඟාවීමට එඩිතර වන්නේ නැත. පාපය ඔබ කෙරෙහි ආධිපත්‍යය නොදක්වයි. ඔබේ චූදිතයාවූ සාතන් ඔබව හෙළානොදකිනු ඇත.

ක්‍රිස්තුස් වහන්සේගේ පූර්ණත්වය

ක්‍රිස්තුස් වහන්සේ තුල ඇති කරුණාවේ පූර්ණත්වය සමග බොහෝ සෙයින් සහ සමීපව කටයුතු කරන්න. ක්‍රිස්තුස් වහන්සේ තුල ඇති මේ සියළු කරුණාව ඇදහිලිවන්තයාගේ විශුද්ධකරණය සඳහාය. **“මක්නිසාද උන්වහන්සේ තුළ වුළු පූර්ණකම පැවතීමටත්, උන්වහන්සේගේ කුරුසියේ ලෙයින් සමාදානය උපදවා, උන්වහන්සේ කරුණුකොටගෙන සියළුදේ, එනම් පොළොවෙහි තිබෙන දේවල් වුවත්, ස්වර්ගවල තිබෙන දේවල් වුවත්, උන්වහන්සේ කරුණුකොටාගන තමන්ට සමගි කරගැනීමටත් පියාණන් වහන්සේ ප්‍රසන්නවූසේක.”** (**කොලොස්සි 1:19-20**) උන්වහන්සේගේ සෙනගගේ අවශ්‍යයතා සහ පාපයේ පැවතීම නිසා හටගන්නා අවශ්‍යතා තරම් විශාල හා හදිස්සි අවශ්‍යතා මොනවාද? දූෂිතබවේ ස්වාභාවය කුමක්වූවත් එය උන්වහන්සේ වෙත ගෙනයාමේ ක්‍රියාවම එහි බලය දුර්වලකරයි. ආශිර්වාදලත් මානසික තත්වය ඔබව ශුද්ධකමේ අභිරහස වෙත පොළඹවනු ලබයි. එය

7 පිටුවට

“එබැවින් පුරුෂයන් සෑමතැන්හීම කෝපයත් විවාදයත් නැතුව, පිරිසිදු අත් ඔසවා යාච්ඤාකරනවාට කැමැත්තෙමි.” (1 තිමෝති 2:8)

6 පිටුවෙන්

ක්‍රිස්තුස් වහන්සේ තුලින්...

එහි ජයග්‍රහනයයි. එහිදී ආත්මයේ නිහතමානීකම, හදවතේ බිඳුණුබව, නිහතමානී පසුතැවිලිවීමෙන් ස්වාමීන්වහන්සේ ඉදිරියෙහි වැඳවැටීම, සමාවදීමේ පූජාව තුල පාපයේ බලයට වඩා ආත්මයාණන් වහන්සේ වාසයකිරීමේ බලය තුවූ සිටීම නිසා එය බලවත් ජයග්‍රහනයකි. වරදකාරීතවය පැමිණෙන විට, දූෂණය ඉහළයනවිට කෙළින්ම යේසුස් වහන්සේ වෙතටයාමට ඉගෙනගන්න. දෙවියන් වහන්සේ සහ ඔබේ ආත්මය අතර දුරක් නොතිබිය යුතුය. පාපය අපව දෙවියන් වහන්සේගෙන් වෙන්කරනු ලබයි. නුමුත් පාපය ගැන වහාම පසුතැවිලිවී වැලපෙමින් එය අත්හැර දැමීමෙන් දෙවියන් වහන්සේ සහ අපගේ ආත්මය මිහිරි, සමීප සහ ශුද්ධ සහයෝගීතාවයකින් එක්කරනු ලබයි. **"එබැවින් සහෝදරවරුනි, යේසුස් වහන්සේ ස්වකීය මාංශය නැමති තිරය වැදින් අප උදෙසා කැපකළ මාර්ගය වන අළුත්වූ ජීවමාන මාර්ගයකින්, උන්වහන්සේගේ ලේ කරුණාකොටගෙන ශුද්ධස්ථානයට ඇතුල්වීමට අපට නිදහස්කම තිබෙන බැවින්ද, දෙවියන් වහන්සේගේ ගෘහය කෙරෙහි අපට උතුම්වූ පූජකයෙක් සිටින බැවින්ද, නපුරු හෘදයසාක්ෂියකින් පීඩිසිඳු වීම පිණිස අපගේ සිත් ඉසිනුලැබ, අපගේ ශරීර වතුරෙන් සෝදනුලැබ, සැබෑවූ සිතක් ඇතුව අදහාගේ නිසැකකමින් ළඟාවෙමු."** (හෙබ්‍රෙව් 10:19-22)

ක්‍රිස්තුස් වහන්සේ තුල ජය

ධෛර්‍යමත් වෙන්න. අණ්ඩර්සවූ ආත්මය විශුද්ධකිරීමේ කාර්‍ය්‍යය නොපසුබට උත්සහය ඇතිවසිටීමට ඔබට අවශ්‍යය සෑම දිරිගැන්වීමක්ම තිබේ. ඔබගේ ගැළවීමේ නියමුවා ඔබ වෙනුවෙන් සටන්කර ජයගෙන ඇති අතර දැන් උන්වහන්සේ තේජාන්විත සිංහාසනය මත හිඳගෙන ඔබව දිරිමත් කරමින් ඔබ නිරතවී සිටින යුද්ධයට අවශ්‍යය ශක්තිය ඔබට සපයයි. **" අදහිල්ලේ යහපත් සටනෙන් සටන්කොට සදුකාල ජීවනය අල්ලා ගනින්න. ඊට නුඹ කැඳවනුලැබ, බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි යහපත් ප්‍රකාශනය කරසිටියෙහිය."** (1 තිමෝති 6:12) **"එබැවින් මාගේ දරුව, ක්‍රිස්තුස් යේසුස් වහන්සේ තුල තිබෙන කරුණාවෙන් ශක්තිමත් වෙයන්න."** (2 තිමෝති 2:1) **"ඩවූහු බැටළුපැටවාණන්ගේ ලේ නිසාද, තවුන්ගේ සාක්ෂියේ වචනය නිසාද, ඩහුගෙන් ජයගත්තෝය. ඩවූහු මරණය විඳිනතරමට පවා තවුන්ගේ ජීවිතයට ප්‍රේමනොකර සිටියෝය."**(එළිදරව් 12:11) **"නුවුත් අපට ප්‍රේමකළාවූ තැනැත්තාවහන්සේ කරුණාකොටගෙන අපි වේසියල්ලේදී අතිශයින්ම ජයගන්නෝවමුව."** (රෝම 8:37)

"සමාදානයේ දෙවියන් වහන්සේම නුඹළා සහවුළින්ම පවිත්‍රකරනසේක්වා, නුඹළාගේ වුළු ආත්මයත්, ප්‍රාණයත්, ශරීරයත්, අපගේ ස්වාමීවූ යේසුස් වහන්සේගේ ඊවේදී නිදොස්ව තිබෙන ලෙස ආරක්ෂාකරනු ලැබේවා." (1 තෙසලෝනික 5:23) ආමේන්.., ආමේන්.., ආමේන්..!

ඔබගේ ආලෝකය බැබළෙන්නට ඉඩදෙන්න

(කොරටියස් බොනාර් විසිනි) (1808-1889)

කිතුණුවෙකුවීම උතුම් දෙයකි. එම නාමයම උතුම්ව තිබේ. ලෝකයේ උතුම් සියළු නාමවලට වඩා සිතාගත නොහැකි තරම් එය ආශිර්වාදලත් සහ තේජාන්විතය. මම කිතුණුවෙකි කියා පැවසීම යනු මම දෙවියන් වහන්සේගේ වංශයට අයත් වන්නෙමි, මම ස්වර්ගයේ ශුද්ධවන්තයෙක්වෙමි, යැයි පැවසීමයි. එසේනම්, ඔබගෙන් බොහෝදේ අපේක්ෂාකෙරේ. පැරණි පෙළපත් නාමයට නින්දනොකරන්න. ස්වර්ගයේ ඔබව නියෝජනය කරන සහ පොළොවේ ඔබව නියෝජනය කරන තැනැත්වහන්සේට නුසුදුසු කිසිවක් නොකරන්න. උන්වහන්සේ ඔබට විශ්වාසවන්තව සිටිනසේක. ඔබත් උන්වහන්සේට එසේ විශ්වාසවන්ත වෙන්න. ඔබ සේවය කරන්නේ කුමන ස්වාමියෙකුටද සහ ස්වාමීන්වහන්සේටදැයි මනුෂ්‍යයන්ට දැනගැනීමට සලස්වන්න. උන්වහන්සේගේ සාක්ෂිකාරයෙක් වෙන්න. උන්වහන්සේගේ කැඩපතක් වෙන්න. උන්වහන්සේගේ යැවුම්පත්‍ර වෙන්න. උන්වහන්සේට ඔබ හරහා ලෝකයට කථාකිරීමට ඉඩදෙන්න. උන්වහන්සේ ඔබගේ ජීවිතයට කුමක්ද? සහ ඔබගේ ජීවිතය අනිත් අයට කුමක්ද? යන්න පැවසීමට ඉඩදෙන්න. උන්වහන්සේ ඔබගැන දෙවියන් වහන්සේට කථාකරන ආකාරයටම මනුෂ්‍යයන්ට ඔබත් උන්වහන්සේ ගැන කථාකරන්න. උන්වහන්සේ ඔබට උන්වහන්සේගේ නාමය ලබාදී ගෞරවකර ඇත. උන්වහන්සේ ඔබට පුත්‍රකම, රාජකීයත්වය සහ සදුකාලික උරුමයක් ලබාදීමෙන් ඔබට ආශිර්වාද කරඇත. ඔබ උන්වහන්සේගේ ප්‍රේමයට යුක්තිය ඉෂ්ඨකරන බවටත්, උන්වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය මහිමයට පත්කිරීමටත් වගබලාගන්න.

ඔබගේ ආලෝකය බබළවන්න. එයට බාදනොකරන්න. එය සැඟවීමට හෝ එයට අන්ධකාරය මිශ්‍රකිරීම නොකරන්න. **"නැගිට බැබළියන්න, මක්නිසාද නුඹේ ආලෝකය පැමුණුනේය. ස්වාමීන්වහන්සේගේ තේජසද නුඹ කෙරෙහි උදාවිය."** (යෙසායා 60:1) එය ඔබ ලබාඇති ප්‍රේමයේ ආලෝකයයි, එය බබළවන්න. එය සත්‍යයේ ආලෝකයයි, එය බබළවන්න. එය ශුද්ධකමේ ආලේකයයි. මම ආලෝකය ලබාගන්නේ කෙසේද? එය පූර්ණලෙස පවත්වාගන්නේ කෙසේද? කියා ඔබ ඇසුවොත් ක්‍රිස්තුස් වහන්සේ ඔබට ආලෝකය ලබාදෙනුඇත. (එපීස 5:14) ලෝකයේ ආලෝකය වන උන්වහන්සේ තුල ප්‍රමාණවත් ආලෝකයක් තිබේ. **"බැටළුපැටවාණෝ එහි ආලෝකයයි."**(එළිදරව් 21:23) බැටළුපැටවාණන්ගෙන් මිස මිනිසාට ආලෝකයක් නැත. අඳුරු ආත්මයක් ආලෝකමත්කර එය බබළවන්නේ කුරුසියයි. එවිට උන්වහන්සේ ආලෝකයේ සිටින ආකාරයටම අපටත් ආලෝකයේ ගමන්කළ හැකිය. **"අප විසින් උන්වහන්සේගෙන් අසාතිබෙන්නාවූ, නුඹළාට දන්වන්නාවූ පණිවිඩය නම්, දෙවියන් වහන්සේ ආලෝකය බවත් උන්වහන්සේ තුල කිසිව අන්ධකාරයක් නැති බවත්ය."** (1 යොහාන් 1:5)

ඔබට ප්‍රේමකර, තමන්වහන්සේගේ රුධිරය කරුණුකොටගෙන ඔබේ පාපවලින් ඔබව පවිත්‍රකල තැනැත්වහන්සේට විශ්වාසවන්තවෙන්න. උන්වහන්සේ ඔබේ දෑතින් එය ලැබීමට සුදුසුව සිටිනසේක. ඔබට උන්වහන්සේ වෙනුවෙන් කළහැකි අවමදේ එයයි. උන්වහන්සේව අනුග මනය කරන්න. උන්වහන්සේ ඔබට මුලින්ම පැවසූ වචනවූයේ, **"මා වෙතට එන්න."** කියාය. ඔබ පැමිණ විවේකය ලබාගත්තේය. නුමුත් උන්වහන්සේ තවත් පණිවිඩදෙකක් එකතුකර ඇත. එනම්, **"මා තුළ රැඳිසිටින්න"** සහ **"මාව අනුගමනය කරන්න."** කියාය. උන්වහන්සේ කුරුසිය රැගෙන ගිය ආකාරයටම ඔබත් ඔබගේ කුරුසිය රැගෙන යන්න. ඔබ උන්වහන්සේව අනුගමනය කරන්න. ඔබ කඳවුරෙන් පිටතට යන්නේ උන්වහන්සේගේ නින්දව දරාගෙ නය. (ලූක් 9:23, හෙබ්‍රෙව් 13:13) යහපත් වාර්තා සහ නරක වාර්තා හරහා උන්වහන්සේව අනුගමනය කරන්න. උන්වහන්සේ ඔබව ඇදගන්නා සේක. ඔබව මෙහෙයවනසේක. ඔබව තබාගන්නාසේක. එබැවින් ඔබ උන්වහන්සේව අනුගමනය කරන්න. ඔබගේ මුළු ජීවිතයම අඛණ්ඩව ස්වාමීන්වහන්සේව අනුගමනය කිරීමකි. **"යමෙක් මට සේවයකෙරේ නම් ඩහු මා අනුව එවා, මම යවිතැනක සිටිම්ද එතැන මාගේ සේවකයාද සිටින්නේය. යමෙක් මට සේවයකෙරේ නම් ඩහුට මාගේ පියාණෝ ගෞරවකරනසේක."** (යොහාන් 12:26) **"මාගේ බැටළුවෝ මාගේ හඬ අසති. මවද ඩවුන් අඳුනමි. ඩවූහු මා පස්සේ එති."** (යොහාන් 10:27) **"එබැවින් යේසුස් වහන්සේ නැවත ඩවුන්ට කථාකරමින්, මම ලෝකයේ ආලෝකයය. මා අනුව එන්නා අන්ධකාරයෙහි නොහැසිර ජීවනයේ ආලෝකය ලබන්නේයයි කීසේක."**(යොහාන් 8:12)

උන්වහන්සේව අනුගමනය කරද්දී ඔබ ඉදිරියදෙස බලනු ඇත. මක්නිසාද උනවහන්සේ යෙරුසලමට යාමට තම මුහුණ ස්ථිරව තබාගත්සේක. ප්‍රේත්‍රුස් උන්වහන්සේව කුරුසියට යාම වැළැක්වීමට කැමතිවූවිට උන්වහන්සේ පිළිතුරු දුන්නේ.., **"නුවුත් උන්වහන්සේ හැරී ප්‍රේත්‍රුස්ට කථාකොට, සාතන් මා පස්සට යව, නුඹ මට බාදුවක්ය. මක්නිසාද නුඹ මනුෂ්‍යයන්ගේ කාරණා මිස දෙවියන් වහන්සේගේ කාරණා කල්පනා කරන්නේ නැතැයි කීසේක."**(මතෙව් 16:23) ඔබත් උන්වහන්සේ මෙන් ඉහළ බලනුඇත. **"යේසුස් වහන්සේ මේ දේවල් කියා, ස්වර්ගය දෙසට ඇස් ඔසවා කියනසේක්, පියාණෙනි, පැය පැමිණ තිබේ."** (යොහාන් 17:1) තවද ඔබගේ ඉරියව්ව, ඉහළ බැලීම වියයුතුය. ඔබගේ චින්දනය ඉහළින් ඇති දේවල් කෙරෙහි යොමුකර ඇත. (කොලොස්සි 3:1) ඔබ කවුද යන්නත්, දෙවියන් වහන්සේ ඔබෙන් අපේක්ෂා කරන්නේ කුමක්ද යන්නත් මතකතබාග න්න. ඔබේම ඇදහිල්ල, විශ්වාසය සහ ඔබගේම යාච්ඤාකිරීම තුල පවතින්න.

දෙවියන් වහන්සේ වෙනුවෙන් යමක් කරන්න

ඔබ ඉපදුනෙත් නැවත උත්පාදනය ලැබුවේත් ඔබවෙනුවෙන් නොවේ. ඔබට බොහෝදේ දීමට නොහැකිවූවත් ඔබටහැකි අයුරින් යමක් දෙන්න. සතුටු සිතින් දෙන අයට ස්වාමීන්වහන්සේ ප්‍රේමකරනබව මතකතබාගන්න. තණ්හාවෙන් පරිස්සම් වෙන්න. මන්ද මුදල්වලට ඇති ආදරය සියළු ආකාර නපුරේ මුලයි. ලෞකිකත්වය ඕනෑම ආකාරයකින් පැමිණෙනවිට එය මුදල්වලට ඇති ආදරය හෝ චින්දනයට ඇති ආදරය වන්නේය. එහිදී ඔබ ක්‍රිස්තුස් වහන්සේට විශ්වාසවන්තව සිටීම නවත්වන අතර දෙවියන් වහන්සේට සහ වස්තුවට යන දෙකටම සේවයකිරීමට උත්සහකරයි.

එසේනම් කාලය පවතිනතුරු දෙවියන් වහන්සේ වෙනුවෙන් යමක් කරන්න. එය දිගුකාලයක් නොවිය හැකිය. මක්නිසාද දවස ගෙවීයන අතර සවස් කාලයේ සෙවනැලි දිගුවේ. සෑමදිනකම යමක් කරන්න. වැඩකරන්න. ඔබගේ හදවත වැඩකිරීමට යොමුකරන්න. තම ස්වාමියා සහ තම වැඩ යන දෙකටම ආදරයකරන මිනිසුන් මෙන් ප්‍රීතියෙන් හා නිවැරදි යහපත් කැමැත්තෙන් වැඩකරන්න. යහපත කිරීමෙන් වෙහෙසට පත්නොවන්න. ඇදහිල්ලෙන් වැඩකරන්න. ප්‍රේමයෙන්, ඉවසීමෙන් සහ බලාපොරොත්තුවෙන් වැඩකරන්න. වෙහෙස මහන්සිවී වැඩකිරීමෙන් හෝ එකඟනොවන රාජකාරීවලින් මාංශය හා රුධිරය උත්සහකරන තනතුරකින් පසුබට නොවන්න. **"ක්‍රිස්තුස් යේසුස් වහන්සේගේ යහපත් සේවායෙකු මෙන් දුක්විඳීමට පංගුකාරයෙක් වෙයන්න."** (2 තිමෝති 2:3) **" එහෙයින් මාගේ ප්‍රේමවන්ත සහෝදරයෙනි, ස්වාමීන්වහන්සේ කෙරෙහි නුඹළාගේ මෙහෙය නිශ්චලනොවන බව නුඹළා දන්නා බැවින් ස්ථිරවව්, නිශ්චලවව්, නිතරම ස්වාමීන්වහන්සේගේ මෙහෙයෙහි වඩවඩා පවතිව්."** (1 කොරින්ති 15:58) ඔබගේ දෑත් නැමෙන්න ඉඩනොදෙන්න. ඔබගේ සැරයැටිය පැත්තකට නොදමන්න. ඔබගේ කඩුව කොපුවේ නොදමන්න. වැඩ නොකර මට ස්වර්ගයට යාහැකිය කියා ඔබටම කියාගනිමින් අලසකමට සහ මාංශයට ප්‍රියජනකවීමට ඉඩනොදෙන්න.

ඔබගේ දීමනා කුඩාවිය හැකිය. ඔබගේ කාලය එතරම් නොවිය හැකිය. එබගේ අවස්ථා ස්වල්ප වියහැකිය. නමුත් වැඩකරන්න. කලබලයෙන් හෝ තමා වැදගත්යයි සැලකීමකින් තොරව නිහඬව එය කරන්න. මනුෂ්‍යයෙක්ව සතුටු කරන ආකාරයෙන් නොව දෙවියන් වහන්සේව සතුටු කරන්න. මනුෂ්‍යයන්ගෙන් ලැබෙන ගෞරවය නොව දෙවියන් වහන්සේගෙන් ලැබෙනදේ සොයන්න. ගෞරවයේ දවස පැමිණේ. ස්වාමියාගේ යහපත්දේ මෙහි සියළු දුෂ්කරතා සහ ශ්‍රමය වෙනුවෙන් ලබාදෙනසේක.

□ හොරටියස් බොනාර් විසින් රචිත, **"බැටළු පැටවා අනුගමනය කරන්න"** යන පොතෙන් සකස් කරන ලද ලිපියකි.

"ශුද්ධකමේ අලංකාරයෙන් ස්වාමීන්ට නමස්කාරකරව්. පොළොවේ සියල්ලෙනි, උන්වහන්සේ ඉදිරියෙහි වෙවුලමින් සිටිව්." (ගීතාවලිය 96:9)

Reg. No: DOP/MAGAZINE/28/2026
30/7,0A චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව.

පවිත්‍රකාර ලෝකයක ශුද්ධවූ ගමනක්

□ ශුද්ධලියවිලි කියවීම; (යාකොබ් 4:1-10)

යාකොබ් අපගේ භක්තිය (විශ්වාසය) තුල ප්‍රායෝගික පැවැත්ම සැබෑ ආකාරයෙන් අපෙන් ඉල්ලා නොසිටින්නේ යැයිද, ඔහු කිතුණු ජීවිතයේ ගැඹුරු අත්දැකීම් සහ සැබෑ කිතුණු හැඟීම් කෙරෙහි අනුකම්පාවක් නොමැති කෙනෙක් යැයිද කිසිවෙකු නොසිතිය යුතුය. මෙම විශුද්ධකරණයේ විෂය සම්බන්ධයෙන් ඔහුගේ ප්‍රතිකාරයේදී අපි ඔහුව අනුගමනය කරනවිට ඔහු අපව ශුද්ධකමේ ගැඹුරට සහ දිව්‍යාප්‍රේමයේ වඩාත් විශිෂ්ඨ ස්පර්ශයන් කරා ගෙනයනබව අපට පෙනීයනු ඇත. නුමුත් ඔහු පළමුව විෂයේ අඳුරු පැත්තෙන් ආරම්භකර කරෙණයේ මුලටම පැමිණේ

ලෞකීක හදවතේ පැරණි හා පවිත්‍රකාර ස්වාභාවය

“නුඹළා අතරෙහි යුද්ධත් ඛබවත් කොයින්ද? ඒවා පැවිණෙන්නේ නුඹළාගේ අවයවයන් තුළෙහි යුද්ධකරන නුඹළාගේ තෘෂ්ණාවලින් නොවේද?” (යාකොබ් 4:1) පාපයේ මුල සහ අපගේ සියළු දුකවන්නේ නපුරු හදවතයි. ඔබ පැරණි ශරීරය පිරිසිදු කරනතුරු අළුත් ඇඳුම් ඇඳීමට උත්සහකිරීමෙන් ඵලක්නැත. පිරිසිදුකිරීම පිටස්තරයෙන් (සමෙන්) නතර නොවියයුතුය. එය හදවතට සහ ඇටමිදුළු වලට ළඟාවියයුතුය. එම පැරණි මළ අශ්වයා ඒ අසල ජලාශයක සිටිනතාක්කල් වඩාත්ම දියුණු ක්‍රමවලින් ඔබේ ජලය පෙරීමෙන් ඵලක්නැත. උෟව එළියටග න්න. එවිට ඔබේ පෙරීම යම් අරමුනක් සඳහා වනුඇත.

එමනිසා දෙවියන් වහන්සේ අපගේ සියළු කරදරවල රහසට, මෙම වැටුණු ස්වාභාවයට, මැරුණු හදවතට, ඔබේ අවයව තුල සටන්කරන ආශාවන්ට පැමිණෙනසේක. රාගය යනුකුමක්ද? එය පාපයට ඇති ආශාව සහ ඊට නැඹුරුවීමයි. එය ඕනෑමදෙයකට, වැරදි ආදරයට, විකෘති ආදරයට, දෙවියන් වහන්සේ වෙතින් තමා වෙතට හැරුණු ආදරයයි. දෙවියන් වහන්සේ සැලසුම් කරන්නේ නපුරු හදවතක මූලධර්මය ඉවත්කිරීමට වනසේක.

යාකොබ් පවසන්නේ මෙම නපුරු ආශාව අපගේ භක්තිවන්ත ජීවිතයට සහ අපගේ යාච්ඤාවලට පවා ඇතුළුවන බවයි. **“නුඹළා ඉල්ලන නුවුත් නුඹළාගේ තෘෂ්ණා ගැන වියදම්කරන පිණිස වැරදි ලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත.” (යාකොබ් 4:3)** එබැවින් මනුෂ්‍යයන් අතර විශාල සමූහයක් ඉල්ලා සිටින්නේ පවිත්‍රකාර ආශාවන් ඇතුවය. එය මනුෂ්‍යයාගේ පවිත්‍රකරකමට සේවයකිරීමට ඉඩකඩ ඇති ස්ථානයක් පමණි. ඔවුන්ගේ නපුරු හදවත තෘප්තිමත් කිරීමේ තවත් ක්‍රමයකි. නාමික කිතුණුවන්ගෙන් විශාල කොටසක් ඔවුන්ගේ පවිත්‍රකාර ආශාවන් විදුලියෙන් සහ රන්වලින් ආලේපකරන්නාක් මෙන් ක්‍රියාකිරීමට දරණ උත්සහයකි. ඔවුන්ගේ විශ්වාසය මනුෂ්‍යයාව නිරයේ අපහසුතාවයන්ගෙන් ඈත්කර තබානැනීම සහ තමාවම සතුටුකරගැනීමේ ජීවිතයක් හරහා සුවපහසු ලෙස ජීවිතය ගතකිරීමට පහසුවක් ලබාදීමයි. නමුත් නපුරු හදවතේ ව්‍යාකූලත්වය පවතියි. එය කොයිතරම් මර්ධනයකලත්, එය ඉවත් කරනතුරු විශුද්ධකරණය ආරම්භවන්නේ නැත. විශුද්ධ කරණය විකෘති කැමැත්තට, වැරදි ආශාවලට, නපුරු දේවලට නැඹුරුවීම්වලට සහ පැරණි ආදම්ගේ ක්‍රියාවන්ට විරුද්ධව කටයුතු කරනුලබයි. එම ක්‍රියාවන් කුරුසියේ ඇණගසන තුරු ඔබගේ හොඳම උත්සහයන් ව්‍යාකූල වනුඇත,

ඔබ කළයුතු පළමුදෙය නම්, ක්‍රිස්තුස් වහන්සේ සමග ඇණගැසීමට ඔබව භාරදීමයි. විශුද්ධකරණය යනු සංස්කෘතියෙන් ඔබගේ පුරුදු වැඩිදියුණුකිරීම හෝ ඔබේ හදවත පිරිසිදුකිරීම නොවේ. නුමුත් විශුද්ධකරණය යනු ස්වාභාවික ජීවිතය නිශ්ඵලදෙයක් ලෙස මරණයට භාරදීමයි. එම ස්වාභාවික ජීවිතය ඔබට කිසිදු යහපතක් කළ නොහැකි තරම් නරකව තිබේ. ඒ වෙනුවට යේසුස් වහන්සේ සමග එක්වීමෙන් අළුත් දෙයක් ලබාගැනීම එනම්, ඔබ තුල වාසයකිරීමට ඔබ හරහා ක්‍රියාකිරීමට, ඔබේ ආදේශකයාවීමට සහ ඔබට ලබාදීමට උන්වහන්සේව වැළඳගැනීමයි. ඒතුලින් උන්වහන්සේගේ ශුද්ධාත්මයාණන් වහන්සේව ඔබගේ හදවතට පිළිගැනීමයි.

එබැවින් විශුද්ධකරණයේ ආරම්භය නම්, ඔබගේ ආශාවන් සහ තේරීම්වලදී ඔබ සම්පූණයෙන්ම වැරදිබව දැකීමයි. ජීවිතයේ මෙහෙයවීම (සුක්කානම) වැරදියි. ඔබ යටත්විය යුතුය. එම මාර්ගයෙන් ඉවත්වී කුරුසියේ මරණයට පත්විය යුතුය. **“නුඹළාගේ අවයවයන් අධර්මිෂ්ඨකමේ ආයුධකොට පාපයට භාරනොදී, නුඹළාව මළවුන්ගෙන් ජීවත්ව සිටින්නන් මෙන් දෙවියන් වහන්සේට භාරවී, නුඹලාගේ අවයවයන් ධර්මිෂ්ඨකමේ ආයුධ කොට උන්වහන්සේට භාරදිපල්ලා.”** (රෝම 6:13) ඉන්පසු ඔබේ ජීවිතය සම්පූර්ණයෙන්ම අළුත් සහ දිව්‍යමයවීමට ඉඩදෙන්න. **“මම ක්‍රිස්තුස් වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබ සිටිමි. එසේවී නුවුත් මම ජීවත්වෙමි. නුවුත් තවත් මා නොව ක්‍රිස්තුස් වහන්සේ මා තුල ජීවත්වනසේක. තවද මා දැන් මාංශයෙහි ජීවත්වෙන ජීවිතය මට ප්‍රේමකළාවූ, මා උදෙසා තමන්ව පාවාදුන්නාවූ දෙවියන් වහනසේගේ පුත්‍රයාණන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ජීවත්වෙමි.” (ගලාති 2:20)** මෙම සත්‍යතාවය අප සියළුදෙනාගේ හදවත් තුල ක්‍රියාත්මක වන බව දැකීමට දෙවියන් වහන්සේ උපකාර කරනසේක්වා.

තහනම් කරනලද ලෝකය සහ නපුරු ලෝකය

“කාමමිත්‍යාචාරිකයෙනි, ලෝකය සමග මිත්‍රකම දෙවියන් වහන්සේට සතුරුකම බව නුඹළා දන්නේ නැද්ද? එබැවින් කවරෙක් නුවුත් ලෝකයට මිත්‍රවෙන්ට කැමැත්තේනම්, ඔහු දෙවියන් වහන්සේට සතුරෙක් වන්නේය.” (යාකොබ් 4:4) ඔබ වැරදි කරන ලෝකයකින් වටවී සිටින අතර ඔබ ලෝකයෙන් මෙන්ම ඔබගෙන්මද ඉවත්විය යුතුය. මෙය සෑමවිටම විශුද්ධකරණයට යායුතු වෙන්වීමකි. විශුද්ධකරණය යනු ඔබ වැරදි බව දැක ඔබව නිවැරදි කිරීම සඳහා උන්වහන්සේගේ ශුද්ධාතමයාණන් වහන්සේ විසින් ක්‍රිස්තුස් වහන්සේට භාරදීමයි. වෙන්වීම යනු ලෝකයට මෙන්ම ඔබ ඔබටම මරණයට පත්වී අළුත් ලෝකයකට, නොපෙනෙන ලෝකයට, පැමිණෙන දේවරාජ්‍යයේ ලෝකයට, දෙවියන් වහන්සේගේ උත්තරීතර වන ලෝකයට ඇතුල්වීම සහ ඔබ **“ක්‍රිස්තුස් වහන්සේ සමග දෙවියන් වහන්සේ තුල සැඟවීසිටීමයි.”(කොලොස්සි 3 :3)** ඔබේ සැබෑ ලෝකය එහි සම්පූර්ණත්වයෙන් හා තේජසින් දිස්වෙන ප්‍රකාශවීමේ දිනය එනතුරු බලාසිටීමයි.

කාමමිත්‍යාචාරිකයෙනි, කියා යාකොබ් ආමන්ත්‍රණය කරන්නේ වචනානසාරයෙන් කාමමිත්‍යාචාරය ගැන නොව අධ්‍යාත්මික කාමමිත්‍යාචාරය ගැනය. එය තම ලෝකයේ ස්වාමිපුරුෂයා වෙතයාමට බැටළුපැටවාණන්ව අත්හැර යන බැටළුපැටවාණන්ගේ මනාලියගේ කාමමිත්‍යාචාරයයි. ඇය ලෝකයේ දැතට යාමෙන් තම ස්වාමියාට අවිශ්වාසවන්ත වන බිරිඳයි. ඔබ ක්‍රිස්තුස් වහන්සේගේ නම්, ඔබ උන්වහන්සේගේ පමණි. උන්වහන්සේ ඔබව තමන්වහන්සේ වෙනුවෙන් ඉල්ලාසිටින අතර උන්වහන්සේ ඕනෑම ප්‍රතිවාදියෙකුටම ඊර්ෂ්‍යීකරයි. එබැවින් යේසුස් වහන්සේගේ ප්‍රේමය සුවිශේෂී බවත්, පැරණි ලෞකීක ජීවිතය හඳුනාගෙන ක්‍රිස්තුස් යේසුස් වහන්සේ වෙත තබා ඇති ආකාරයටම ඔබ ලෝකයට කුරුසියේ ඇණගසනු ලැබියයුතු බවත් යාකොබ් මෙහිදී අපට පවසයි. ලෝකය යනු කුමක්ද? එයින් අදහස් කරන්නේ අප ආහාරගැනීම, වැඩකිරීම, යහපත් පුරවැසියන්වීම නතරකලයුතු බව නොවේ. එහි අර්ථය අපි ලෝකයට ඇති ආදරයට මියයායුතු බවත්, අපි වර්තමාන යුගය වෙනුවෙන් ජීවත්වීම සහ ඊට අයත්වීම නවතා ඉක්මනින් එළිදරව්වීමට නියමිත

(එ.බී. සිම්ප්සන් විසිනි) (1843 - 1919)

අපගේ ස්වාමීන් සහ ගැළවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ රාජ්‍යයේ සහ ඉදිරි යුගයේ දරුවන් වියයුතුය. මෙම තහනම් ලෝකය ගැන යොහාන් අපට සියල්ල පවසයි. **“මක්නිසාද ලෝකයෙහි තිබෙන සියල්ල එනම්, මාංශයේ තෘෂ්ණාවත්, ඇස්වල තෘෂ්ණාවත්, ජීවිතයේ අහංකාරකමත්, පියාණන් වහන්සේගෙන් නොව ලෝකයෙන්වේ.” (1 යොහාන් 2:16)** මෙය ශුද්ධවූ ත්‍රිත්වයේ දෙවියන් වහන්සේට එරෙහි වන්නාවූ ත්‍රිත්වයකි.

මාංශයේ තෘෂ්ණාව

මෙයින් අදහස් කරන්නේ ඔබගේ ඉන්ද්‍රියන්ගේ රුචි අරුචිකම්, ආශාවන් තෘප්තිමත් කරගැනීමයි. නීතිය තුල හෝ නීතියෙන් තොරව තමන්ගේ යහපත සඳහා කාමුක තෘප්තියෙන් ඉන්ද්‍රියන්ගේ සතුට භුක්තිවිඳීමට ඇති ආශාව සහ ඒවා ඔබගේ පැවැත්මේ අරමුණු සහ අභිප්‍රායන් බවට පත්කරගැනීමයි. ජීවත්වීමට ඔබ ආහාර ගතයුතුය නමුත් ඒ උදෙසා ජීවත්වීම අවශ්‍යය නොවේ. ආහාරගැනීම සහ එහි සාධාරණ සතුටක් ලැබීම නිවැරදිය. මක්නිසාද දෙවියන් වහන්සේ අපට රසවිඳීමේ හැකියාව ලබාදී තිබෙනසේක. නමුත්

ඉතිරි කොටස ඊලඟ කලාපයෙන්

වැදගත් දැන්වීමක්...

පෙරමග දූතයා පත්තරයට කිසිදු විදිහක අයකිරීමක් නොකරන අතර එය නොමිලේ බෙදාහැරේ. දායක මුදලක් මේ පත්‍රයට අය නොකරන නමුත් මෙහි වියදම් සඳහා කිසියම් මුදලක් දීමට පෙළඹීමක් ඇත්නම් එය කෙලින්ම සංස්කාරකට පමණක් එවන්න.

මුලසිට අග දක්වා නිවැරදි දේව වචනය අඩංගු බයිබලය පැහැදිලි කරමින් ක්‍රිස්තුස් වහන්සේ දෙවන පැමිණීමට සෙනඟක් සුදානම් කිරීම පෙරමග දූතයා පත්‍රයෙහි මූලික පරමාර්ථය බැවින් අන්තර් ආගමික හෝ අන්තර් නිකායික වාදවිවාද වලට මෙහි ඉඩ සලසා දෙන්නේ නැත. එහෙත් ඔබගේ ආත්මික ජීවිතයේ යම්කිසි ගැටළුවක් පැන නැගී නම් දේව වචනය අනුව එය විසඳා ගැනීමට අපට ලියා එවන්න. පෙරමග දූතයා පත්‍රයෙන් ඔබට ලැබෙන්නා වූ ආශීර්වාදයන් ලියා එවීම අපට සතුටක් වන අතර දෙවියන් වහන්සේට මහිමය ගෙන දෙන්නකි.

අපගේ උත්සාහය යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ සාක්ෂිකරුවන් හැටියට සේවය කිරීමයි. එබැවින් අපට නිකායක් නැත. කිසිම චේතනයක් හෝ වැටුපක් නොලබන අපි මෙම සේවයේ දියුණුව උදෙසා උනන්දුකමින් යාච්ඤා කරන මෙන් ඔබගෙන් ඉල්ලා සිටිමු.

ඔබගේ සියළුම ලිපි, ආධාර මුදල් (චෙක්පත් හෝ මුදල් ඇණවුම්) යාච්ඤා ඉල්ලීම්. සාක්ෂි සහ ඔබගේ ගැටළු මෙසේ එවන්න.

සංස්කාරක:
පෙරමග දූතයා
30/7, චාල්ස් පෙදෙස, රාවතාවත්ත, මොරටුව

මොරටුව රාවතාවත්තේ පදිංචි ගරු දේවගැති වීරප්පුලිගේ නිස්සංක වෙනුවෙන් කොළඹ 10, ජයන්ත වීරසේකර මාවතේ අංක: 47, දරන ස්ථානයේපිහිටි ස්ටාර් මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.